# ග්‍රාමීය සංවර්ධනයේ දී ජනතා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය සංකල්පයේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික අත්දැකීම් ආශ්‍රයෙන් කෙරුණු විමසුමක්

ආර්.එල්.එන්. ජයතිස්ස

## සංක්ෂේපය

*සංවර්ධනය යනු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. ජන සමාජයක පැවැත්මට අවශ්‍ය සියලුම ආර්ථික, සාමාජික, සංස්කෘතික යටිතල පහසුකම් එම යුගයට සරිලන පරිදි සැපයීම සංවර්ධන ක්‍රියාදාමය නම් වේ. ලෝකයේ දියුණු වෙමින් පවතින රටවල් අනුගමනය කරමින් පැවති සංවර්ධන උපාය මාර්ගය වූයේ නගරය කේන්ද්‍ර කරගත් කාර්යාලයන්හි සැලසුම් නිලධාරීන්ගේ සිතැඟි පරිදි සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීමයි. එහිදී ජනතාවගේ අවශ්‍යතාවයන් අනුව යමින් ජනතාව කේන්ද්‍ර කර ගනිමින් ඔවුන් සමග බද්ධ වූ සංවර්ධන සැලසුම් සකස් කිරීමක් හා ක්‍රියාවට නැංවීමක් එකල සිදු නොවීය. එනම් ජනතා සහභාගීත්වයෙන් තොර සංවර්ධන ක්‍රියාවලියකි. මෙම පසුබිම මත ලෝකයේ රටවල් පිළිබඳව අවධානය යොමු කරන විට සංවර්ධනය මැනීමට භාවිත කරන සංවර්ධන දර්ශකයන් සේ ගැනෙන ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, මන්දපෝෂණයට ගොදුරු වී ඇති සංඛ්‍යාව, ළදරු මරණ අනුපාතය, සාක්ෂරතා මට්ටම හා ප්‍රාදේශීය භෞතික සංවර්ධනය යන කරුණු දියුණු රටවල් හා සසඳන කල ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල දුර්වල අඩියක පවතී. වසර ගණනාවක් තිස්සේ භාවිත ක්‍රමය වූ ජනතාව කේන්ද්‍ර කර නොගත් සංවර්ධන ක්‍රියාදාමයකින් ජනිත වූ ප්‍රතිඵලය මෙය වන්නේය. මෙම තත්ත්වය පිළිබඳව විද්වත් මතවාද ඇති වූ අතර වඩාත් හොඳ සංවර්ධන ප්‍රවේශයන් පිළිබඳව අවධානය යොමු විය. එම ව්‍යායාමය ඔස්සේ සංවර්ධන විශේෂඥයන් තම පර්යේෂණ ආශ්‍රයෙන් නවතම සංවර්ධන ක්‍රමෝපායයක් වශයෙන් ජනතා සහභාගීත්ව සංවර්ධන සංකල්පය 1980 දශකයේ සිට හඳුන්වා දුන්නේය. මෙසේ එළි දැක්වුණු ජනතා සහභාගීත්ව සංවර්ධන සංකල්පය මෙයින් පසුව ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතිවල අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් ජනප්‍රියත්වයට පත් වූයේය. එවකට ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය නමින් හැඳින් වූ අප ආයතනය සහභාගීත්ව සංවර්ධන සංකල්පය පිළිබඳ ඉගෙනුම් අත්දැකීමක් ලබාගනු පිණිසත්, එය සංවර්ධන කටයුතු වල දී පූර්වාදර්ශයක් වශයෙන් භාවිතා කිරීමත් අරමුණු කොට ගනිමින් 1992/93 වර්ෂවල ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියක් "කැලේගම කුඩා වැව් සංවර්ධන ව්‍යාපෘතිය" නමින් ක්‍රියාත්මක කළේය. කැලේගම යනු වියළි කලාපයේ දිළිඳු ගොවි ප්‍රජාවකගෙන් සමන්විත කුඩා ගම්මානයකි. කුඩා වැව් පුනරුත්තාපන ව්‍යාපෘතිය ජනතා සහභාගීත්වය මත ජන අවශ්‍යතාවයන් පරිදි සැලසුම් කොට ගොවි ජනතාව විසින් ක්‍රියාත්මක කළේය. ගොවි ජනතාවගේ ශ්‍රමය කැප කිරීම වෙනුවෙන් දෛනික ගෙවීමක් ව්‍යාපෘතිය මගින් සිදු කළේය. මෙම පසුබිම මත ජනතා සහභාගීත්වය නිසර්ගයෙන් සිදු වූ සහභාගීත්වයක් නොවන අතර එය පොළඹවන ලද සහභාගීත්ව ගණයට අයත් වන්නේය. ජනතා සහභාගීත්වය සඳහා සාධක රාශියක් බලපාන්නේය. කැලේගම ව්‍යාපෘතියේ දී ජනතා සහභාගීත්වය සඳහා බලපෑ හේතු කතෘවරයාගේ අත්දැකීම් මත විශ්ලේෂණය කෙරේ. එම සාධක අතර සමාජයීය සාධක, කුඹුරු ඉඩම් හිමිකම, ඓතිහාසික සාධක, දේශපාලනික සාධක, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ හැසිරීම් රටාව, යන සාධක විශ්ලේෂණය කරනු ලබන්නේය. සංවර්ධන සාහිත්‍ය අනුසාරයෙන් ද ජනතා සහභාගීත්වය සඳහා බලපාන සාධක මෙහි දී විග්‍රහ කරන අතර ඒ යටතේ භෞතික හා සමාජ විද්‍යාත්මක සාධක, ආර්ථිකමය සාධක, දේශපාලනික සාධක, සමාජයීය සාධක, සංස්කෘතිකමය සාධක, පරිපාලනමය සාධක, ඓතිහාසිකමය සාධක විග්‍රහ කෙරෙන්නේය. පවතින සමාජ, ආර්ථික යථාර්තය අනුව යමින් උපරිම ප්‍රජා සහභාගීත්වයක් මත සංවර්ධන කටයුතු කරගැනීම ඒවායේ තිරසාර හා අර්ථාන්විත බවට හේතු වන බව අවසාන වශයෙන් අවධාරණය කෙරේ.*

ශ්‍රී ලංකාව විශාල ග්‍රාමීය අංශයකින් සමන්විත රටකි. ජන හා නිවාස සංගණනය 2001 ට අනුව, රටේ ජනගහනයෙන් 14.6% නාගරික අංශයේ ද, 5.3% වතු අංශයේ ද, 80% ග්‍රාමීය අංශයේ ද ජීවත් වන

බව හෙළිවීමෙන් මෙම තත්ත්වය තහවුරු වෙයි. ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා දරන උත්සාහයේ දී ග්‍රාමීය අංශයේ සංවර්ධනය අතිශය වැදගත්කමක් දරන්නේ ඒ නිසාය. ග්‍රාමීය අංශයේ සංවර්ධනය සඳහා වාර්ෂිකව අතිවිශාල දේශීය හා විදේශීය සම්පත් ප්‍රමාණයක් වැය කරන අතර ඒවායින් ඵලදායී ප්‍රතිලාභ අත් කර ගැනීම සඳහා නිවැරදි සංවර්ධන ප්‍රවේශයක් භාවිතා කළ යුත්තේය. ඉහළ සිට පහළට සිදු කරනු ලබන (top down approach) සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශයෙන් තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කරගැනීමට මෙතෙක් දැරූ උත්සාහය ගැටලුකාරී එකකි. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා උචිත සංවර්ධන ප්‍රවේශයක් ලෙස 1980 දශකයේ එළිදැක්වී ජනප්‍රියත්වයට පත් වූ 'ජනතා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය' පිළිබඳ න්‍යායාත්මක පසුබිම හා එම ප්‍රවේශය වර්තමාන සමාජ ආර්ථික සංදර්භය තුළ භාවිතයට ගැනීමේ දී ලත් අත්දැකීම් විග්‍රහ කරමින් එහි ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි.

## 1.1 සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශයෙන් තෙවන ලොවට දායාද වී ඇති ප්‍රතිඵල

සංවර්ධනය මැනීමෙහි යොදාගනු ලබන නිර්ණායක භාවිතා කරමින් ලෝකයේ එක් එක් කලාපවලට අයත් රටවල ආර්ථික හා සාමාජීය පසුතලයන් පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන විශ්ව සංවර්ධන වාර්තාව (2003) පළ කර ඇති සංවර්ධන සංඛ්‍යා දත්ත මඟින් තුන්වන ලෝකයේ ජනතාවගේ පහත් ජීවන තත්ත්වය පිළිබඳව හෙළිදරව් කිරීමක් සිදු කරයි. එම වාර්තාවට අනුව දකුණු ආසියාවේ, ලතින් ඇමරිකාවේ සහ අප්‍රිකානු උප සහරාවේ රටවල් වර්තමානයේ මුහුණ දී සිටින ප්‍රධාන ගැටළුව වී ඇත්තේ දුප්පත්කම වන අතර සෙසු ගැටලු ඒ හා බැඳී පවතී. මෙම කලාපවලට අයත් රටවල පවතින සමාජ-ආර්ථික පසුතල ඉතා කණගාටුදායකය. උදාහරණ වශයෙන් ඉහළ ආදායම් ලබන රටවල උපතේ දී ජීවන අපේක්ෂාව 2001 වර්ෂයේ දී අවුරුදු 78.1 වන අතර එය ශ්‍රී ලංකාවේ අවුරුදු 72.3ක් වශයෙන් තරමක සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරයි. අප්‍රිකානු උපසහරා ප්‍රදේශයේ රටවල ජීවන අපේක්ෂාව අවුරුදු 46.5 ද, දකුණු ආසියාතික රටවල අවුරුදු 62.8 ද, වශයෙන් පහළ මට්ටමක් වාර්තා වී තිබේ.

වැඩිහිටි සාක්ෂරතා අනුපාතය මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය රටවල 2001 දී 99.3 ක් වූ අතර, ශ්‍රී ලංකාවේ එය 91.9 ක් වශයෙන් ඉහළ මට්ටමක් වාර්ථා වී ඇත. මෙය අප්‍රිකානු සහ උපසහරා ප්‍රදේශවල 62.4% ද, දකුණු ආසියානු රටවල 56.3 ද ලෙස පහත් මට්ටමක් බව වාර්තා වේ. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, 2001 වර්ෂයේ දී ඉහළ ආදායම් ලබන රටවල්හි ඇමරිකානු ඩොලර් 26,989 වන අතර ශ්‍රී ලංකාවේ 3,180 ද, අප්‍රිකානු උපසහරා ප්‍රදේශයේ 1,831 ද, දකුණු ආසියාවේ 2,730 ද වශයෙන් අඩු ප්‍රමාණයක් වාර්තා වී ඇත. මුළු ජනගහනයෙන් මන්දපෝෂණයෙන් පෙළෙන ජනගහනය මධ්‍යම සහ නැගෙනහිර යුරෝපයේ 2000 වර්ෂයේ දී 9% ක් වැනි අඩු මට්ටමක් පෙන්වන අතර ශ්‍රී ලංකාවේ 23% ද,, අප්‍රිකානු සහ උපසහරා ප්‍රදේශයේ 33% ද, දකුණු ආසියානු රටවල 34% ද, ලෙස ඉහළ අගයක් පෙන්වයි. ඉහළ ආදායම් ලබන රටවල 2001 වර්ෂයේ දී ළදරු මරණ අනුපාතය, ජීව උපත් දහසකට 5 දෙනෙක් ද, ශ්‍රී ලංකාවේ 17 ක් ද, අප්‍රිකානු සහ උපසහරා ප්‍රදේශයේ 107 ක් ද ලෙස වාර්තා වී ඇත. කලාපයන් තුළ ක්‍රියාවට නංවන ලද සංවර්ධන ක්‍රමෝපායයන් වලින් ජනිත වී ඇති ප්‍රතිඵල වල තත්ත්වය මෙයින් පෙන්නුම් කරයි. ඉහළ සිට පහළට සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් වලින් නෙලාගන්නා ලද ප්‍රතිඵල එම රටවල ආර්ථික-සාමාජීය පුනර්ජීවනයකට වඩා ප්‍රපාතයකට හෙලා ඇති බැව් මේ අනුව පැහැදිලි වේ.

## 1.2 ග්‍රාමීය සංවර්ධනයේ දී ජනතා සහභාගීත්ව සංකල්පය පිළිබඳව විද්වත් අදහස්

ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ දී 'ජනතා සහභාගීත්ව සංකල්පය' පිළිබඳ විද්වතුන් රාශියක් අදහස් පළ කර ඇති අතර එම අදහස් කිහිපයක් පහතින් විමර්ශනයට ලක් කෙරේ.

'ජනතා සහභාගීත්ව සංකල්පය' පිළිබඳ Cohen and uphoff (1971) ගේ අදහස් දක්වා ඇත්තේ මෙසේය. **'සංවර්ධන වැඩසටහන්වල දී කුමක් කෙසේ කළ යුත්තේ ද, පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ ජනතා සහභාගීත්වය, සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක අවධියේ දී ප්‍රජා සංවිධානයන්හි සහයෝගීත්වය සහ විවිධාකාර සම්පත්වලින් දායකවීම, සංවර්ධන වැඩසටහන ඇගයීමේ උත්සාහයේ දී ප්‍රජා සහයෝගීත්වය සහ සංවර්ධනයේ ප්‍රතිලාභ ඔවුනොවුන් අතර බෙදාහදා ගැනීම, ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේ දී ජනතා සහභාගීත්ව සංකල්පය නම්, වේ.** මෙම අර්ථ දැක්වීම අනුව සහභාගීත්ව ක්‍රියාදාමයේ ප්‍රධාන අංග 4 ක් පිළිබඳව කරුණු දැක් වේ. එනම් සංවර්ධන ව්‍යාපෘති ඇරඹීම, ඒ සම්බන්ධ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ බෙදා හදා ගැනීම සහ ඇගයීම යන අවස්ථාවන්හි දී ජනතා සහභාගීත්වය මත ඒවා සිදු කිරීමයි. සම්පත් වලින් දායකවීම යනු ශ්‍රමය සැපයීම, ද්‍රව්‍ය සැපයීම, භාණ්ඩ සැපයීම සහ තොරතුරු සැපයීමයි. 'ජනතා සහභාගීත්ව සංකල්පය' යනු ග්‍රාමීය සංවර්ධන කාර්යයේ සැලසුම් අවධියේ සිට ප්‍රතිලාභ ලබාගැනීමේ අවධිය දක්වා ජනතා සහභාගීත්වය මත එය සිදු කිරීම Cohen and uphoff ගේ විග්‍රහයයි.

ජනතා සහභාගීත්වය පිළිබඳව විමසුමක යෙදෙන Nyerere (1968) දක්වන්නේ **'පිටස්තර සම්පත්, පිටස්තර විපර්යකාරකයින් සහ ජනතාවගේම සම්පත් යොදා ගනිමින් ඔවුන් විසින්ම කරගනු ලබන අන්‍යෝන්‍ය සංවර්ධන ඉගෙනුම් අත්දැකීම ජනතා සහභාගීත්වය බව'යි.** මෙම අර්ථ දැක්වීම අනුව පිටස්තර සහ ජනතාවගේම භෞතික සහ මානව සම්පත් භාවිතා කරමින්, පිටස්තර විපර්යකාරකයන්ගේ සහභාගීත්වයෙන් ජනතාව විසින්ම සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවා ගැනීමයි.

**'සහභාගීත්ව සංවර්ධන සංකල්පය'** පිළිබඳව අදහස් දැක්වීමක යෙදෙමින් Schumacher (1973) පෙන්වා දෙන්නේ **'සංවර්ධනය යන්න භෞතික භාණ්ඩ වලින් තක්සේරු කල නොහැකි අතර ජනතාවගේ අධ්‍යාපනය, සංවිධානය සහ විනයගරුක බව යන අංග තුන නොමැතිව සංවර්ධනයේ ශක්‍යතාව උකහා ගැනීම අපහසු බවයි.'** එනම් සංවර්ධනයේ දී අදාල ජනතාවම ඒ සඳහා කේන්ද්‍ර විය යුතු අතර ඔවුන්ගේ බුද්ධිය විනයගරුක බව හා අධ්‍යාපනයෙන් ලත් දැනුම සංවර්ධන ක්‍රියාවේ සාර්ථකත්වය සඳහා බලපාන බවයි.

**'ජාතික සංවර්ධනයට දායක වීමේ බලාපොරොත්තුවෙන් ජනතාව විසින් ස්වෙච්ඡාවෙන් ජනතා වැඩසටහන් සඳහා දායක වීම ජනතා සහභාගීත්වය යනුවෙන්'** සැලකිය හැකි බව සංවර්ධන වැඩසටහන් සඳහා ජනතා සහභාගීත්වය පිළිබඳව අදහස් දක්වමින් Economic Commission for Latin America (1973) උපුටා දක්වන Oakley (1991) පෙන්වා දෙයි.

**'සහභාගීත්වය ලෙස සලකන්නේ මෙතෙක් පාලනයකින් පිටස්තරව පැවති ජනතා ව්‍යාපාරයන් සහ ජනතා කණ්ඩායම් සඳහා සමාජ තත්ත්වයක් දීමෙන් ආයතන ක්‍රමවත් කිරීම සහ සම්පත් පාලනය වැඩි කිරීම සඳහා සංවිධානාත්මක උත්සාහයන් දැරීම'** යනුවෙන් සහභාගීත්ව සංකල්පය පිළිබඳව අදහසක් ඉදිරිපත් කරමින් Pearse and Stiefel (1979) ප්‍රකාශ කර ඇත.

**'විශ්වාසය, පුද්ගල වර්ධනය, ආදායම හා සමාජ සම්මුතිය පුළුල් වන අර්ථයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීම, මඟපෙන්වීම සඳහා ප්‍රතිලාභීන් හෝ අනුග්‍රාහක කණ්ඩායම් මෙහෙයවන උද්‍යෝගී ක්‍රියාදාමයක් '** ලෙස ජනතා සහභාගීත්ව සංකල්පය හැඳින්විය හැකි යැයි Paul (1987) ප්‍රකාශ කරයි.

## 1.3 සහභාගීත්ව සංවර්ධන සංකල්පය එළිදැක්වීමට හේතු වූ පසුබිම

නව ජාත්‍යන්තර සමාජ ක්‍රමයන් සංවර්ධන මාදිලි (development models) එළිදක්වා ඇත. මේ අතරින් නවීකරණ සංවර්ධන න්‍යාය අවධාරණය කරන්නේ පිටත සිට ප්‍රාග්ධනය යෙදූ විට එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිලාභ සමස්ථ සමාජය පුරා විසිරීමෙන් එම සමාජය ඔසවා තැබීමක් සිදු වන බවයි. මෑතක දී නිදහස ලබාගත් ජාතීන් ද, මෙම සංවර්ධන උපාය මාර්ගයන් අනුගමනය කළ අතර යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට උත්සාහ කිරීමෙන් කාර්මිකරණයට ළඟාවීමට ක්‍රියා කළේය. මෙම සංදර්භයේ දී ග්‍රාමීය දුප්පතුන් සංවර්ධනය නැමති 'හිනිමගට' මුහුණ දුන්නේ ය. එහෙත් අධ්‍යාපනයෙන්, ප්‍රජා සංවර්ධනයෙන් සහ සම්පත් සංචලනයෙන් ගම්බද ප්‍රදේශ ජාතික සංවර්ධනයේ පසුපසින් සිටියේය. ග්‍රාමීය සංවර්ධනය නැමති සීමාවෙන් පිටත ග්‍රාමීය දුප්පතුන් සිටි අතර සංවර්ධන වැඩසටහන්වල මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ පිටස්තරයන් ය. නාගරික පරිපාලකයන් යන සැලසුම්කරුවන් විසින් ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කිරීමේ දී ග්‍රාමීය ජනතාව සඳහා අවධානය යොමු කලේ ඉතා සුළුවෙනි. ග්‍රාමීය ප්‍රජාව සැලකුවේ පාරම්පරික, ඉතාම ප්‍රාථමික පුද්ගලයන් ලෙසිනි. නවීකරණය වීමේ සංවර්ධන උපාය මාර්ගයන්හි ප්‍රතිඵලයක් වශයෙන් දියුණු වෙමින් පවතින රටවල අසමතුලිත ආර්ථික වර්ධනය, ජන සංක්‍රමණය වැඩිවීම, සමාජයේ සමහර කොටස් ප්‍රජා ප්‍රතිලාභ ඩැහැගැනීමත්, වැඩිවෙමින් පැවතුන බහුතරයට එය නොලැබී යාමත් යන සාධක පිළිබඳව අවධානය යොමු කිරීමක් සිදු වූයේ නැත. එම නිසා නවීකරණ සංවර්ධන මාදිලියෙන් බලාපොරොත්තු වූ සංවර්ධනයක් ලඟා කර ගත නොහැකි විය.

යැපීම් න්‍යාය අවධානය යොමු කරන්නේ එක් ජාතියක් තවත් ජාතියක් මත යැපීමකි. මෙය අන්තර් යැපීමක් විය. මෙය ඇතැම් විට අන්තර් යටත් විජිතවාදයක් ලෙස ද පෙනුණි. මෙයින් දැක්වෙන්නේ යම්කිසි කලාපයක් ප්‍රධාන නගරයක්මත ගමක් නාගරික ප්‍රදේශයක්මත, දුප්පත් ජනතාව පොහොසත් ජනතාව මත, අඳ ගොවීන් ඉඩම් හිමියන් මත හා ස්ත්‍රීන් පුරුෂයන් මත යැපීම ආදී වශයෙනි. Oakley and Marsden (1982) ට අනුව, මෙම සංවර්ධන මාදිලීන් යටතේ යම්කිසි සංවර්ධනයක් සිදු වුව ද, මෙම සංවර්ධන උපාය මාර්ග අනුගමනය කළ වැඩසටහන් වලින් ද ග්‍රාමීය දිළින්දන් නොතකා හැර තිබුණි. දුප්පත්කමේ අගාධයෙන් දිළින්දන් බැට කෑවේය. ග්‍රාමීය අංශයේ දුප්පතුන් භූගෝලීයමය, සමාජයීය සහ සංස්කෘතිකමය වශයෙන් හුදකලා විය. Oakley සහ Marsden පහතින් පෙන්වා දෙන **'සංවර්ධනය සඳහා සම්පත් ළඟාකර ගැනීමේ හිඟකම, දුප්පතුන්ගේ හැඟීම් නියෝජනය කිරීමට සූදානම් වූ සංවිධානයන්හි හිඟකම, ගම් මට්ටමින් මුදල් ණයට දෙන්නන්ගේ හා වෙළඳුන්ගේ අධිකාරී බලය, ග්‍රාමීය දිළින්දන්ගේ ජීවිතවලට ස්වභාවයෙන්ම උරුම වී තිබූ කුඩාකම හා යැපෙන සුළු බව'** යන ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ දිළින්දන් දරිද්‍රතාවයේම නිමග්න වී සිටිය අතර ඔවුන් එයින් මුදවා ගැනීමට අනුගමනය කරන ලද සංවර්ධන උපාය මාර්ගයන් සමත් වී නැති බවයි.

කිසියම් සමාජයක ආර්ථික, සාමාජික, දේශපාලන ගැටලු විසඳා සංවර්ධනයක් ඇති කිරීමට නම් ජනතා සහභාගීත්වයේ අවශ්‍යතාවය හුවා දක්වමින් Oakley (1991) මෙසේ පවසයි. **'ජනතාවගේ ජන ජීවිත පාලනය කරන බලවේගයන් සම්බන්ධයෙන් බලපෑම් කිරීමට ග්‍රාමීය ජනතාවගේ හැකියාවන් සංවර්ධනය කිරීම අතිශයින් වැදගත් වන්නේ ය. සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය අමතක කර ඇත. එසේ වුවත් සංවර්ධන වැඩ කටයුතු වලින් ප්‍රතිලාභ ලැබීමේ අවස්ථා නොතකා හැර ඇති බහුතර පිරිසට සහතික කිරීම සඳහා ඒ පිළිබඳව යළි සිතා බැලිය යුතුය.'** මෙහිදී එළිදැක්වී ඇති වැදගත් අදහසක් වන්නේ සංවර්ධන ක්‍රියාදාමයේ දී ග්‍රාමීය ජනතාවගේ පූර්ණ සහභාගීත්වය සහතික කිරීම පමණක් නොව ඒවායේ ස්වභාවය, දිශාව තීරණය කිරීම හා එහි නායකත්වය ගැනීම ද ඔවුන් විසින් කළ යුතු බවයි.

සංවර්ධන ක්‍රියාවලියෙහි ජනතා සහභාගීත්වය සංවර්ධිත සමාජයන්හි වඩාත් කැපී පෙනිණි. අඩ සියවසකට පමණ පෙරාතුව "Daniel Lerner" (1958) ලියා ඇති ආකාරයට **සම්ප්‍රදායික සමාජය වනාහි සහභාගීත්වයෙන් තොර වූවකි. නූතන සමාජය වනාහි සහභාගීත්වයෙන් යුතුය. පුරවැසි ක්‍රියාකාරී කණ්ඩායම් නිසා තීරණ ගැනීමේදී වැඩි ජනතා මැදිහත්වීමක් සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ රටවලට වඩා සංවර්ධිත රටවලින් දෘශ්‍යමාන වේ. වර්තමානයේ දී, වර්ධනය වෙමින් පවතින එකගතාවයක්/ඒකමතික බවක් වන්නේ සෑම ප්‍රදේශයකම වෙසෙන ජනතාවගේ ජීවිතවලට බලපාන තීරණයන්ට සම්බන්ධවීම සිය මූලික මානව අයිතියක් බවයි. අතීතයේ දී, පොදු ජනතාව තීරණ ක්‍රියාවලියෙහි වැදගත් නොවීය. පනහ දශකයේ දී, සංවර්ධනය යන්නට අර්ථ දැක්වූයේ වර්ධනය මූලික කොට ගත් සහ ප්‍රාග්ධන සියුම් ක්‍රියාවලියක් වශයෙනි. පරිපාලනය යන්න අවබෝධ කොට ගැනුනේ ඉහළ සිට පහළට යොමු වූ ක්‍රියාවලියක් ලෙසය. එකී ආර්ථික සංවර්ධන ක්‍රමෝපායයෙන් අවධාරණය කොට ඇත්තේ ප්‍රාග්ධන සැකසුම සහ තාක්ෂණය ලබාදීමයි. ඉන් උපකල්පනය වූයේ වර්ධනයේ ප්‍රතිලාභ පහළ සිටින දුප්පතුන් වෙත 'කාන්දුවීමට සැලැස්වීමක් ලෙසින් සහ සවර්ධන ක්‍රියාවලියේ දී මහජන සහභාගීත්වය උත්තේජනය කිරීමක්, ලෙසිනි (නානායක්කාර වී.කේ.2006).**

ඉහත අදහස්වලින්ද පැහැදිලි වන පරිදි එකී කාලවකවානුවේ පැවති සැලසුම් ක්‍රියාවලිය නිශ්චිතාර්ථයෙන් ඉහළ සිට පහළට යොමුවූවක් විය. ගම්මානයන්හි ජීවත්වන ජනතාව සඳහා වඩාත් සුදුසු දේ තීරණය කළෝ ඔවුහු ය. සංවර්ධන අභ්‍යාසයන්/උත්සාහයන් මගින් දුප්පතුන් උනන්දු කළ නොහැකි විය. සංවර්ධන ක්‍රියාවලියේ දී අතිශය වැදගත් වන්නා වූ සම්පත ඔවුන්ගේ ජනතාව වන බවට දැනුවත්වීම, වර්ධනය වීම මෙම වෙනස් වූ තත්ත්වයයි. එමනිසා, ක්‍රම සම්පාදකයින් දැන් විමසා සිටින්නේ ජනතාවගේ සහභාගීත්වය යනු සංවර්ධන ඵලයෙහි පංගුව බෙදා ගැනීම පමණක් නොව සංවර්ධනය සහ වෙනස් වීම යන ක්‍රියාවලියට ඉන් දායකත්වයක් ද ලබාදීම සම්බන්ධයෙනි.

ඉහත අදහස් දැක්වීමට අනුව සහභාගීත්වය යන්නෙන් අර්ථ දැක්විය හැක්කේ පොදු අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී, විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වැඩි සාධාරණත්වයකින් බෙදීයාම පිළිබඳ සාමූහික වූ ද චිරස්ථායි වූ ද ක්‍රියාකාරකමක් වශයෙනි.

ඉහත සඳහන් කළ ප්‍රශ්න විසඳා ගැනීම සඳහාත්, දුප්පතුන්ගේ ජීවන මාර්ග තිරසාර ලෙස වැඩි දියුණු කරලීම සඳහාත් ජනතා සහභාගීත්ව සංකල්පය අත්‍යවශ්‍ය බව 1970 වන විට ලෝකයේ සංවර්ධන විශේෂඥයින්ට අවබෝධ වී තිබිණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනයන් වන ජාත්‍යන්තර කම්කරු කාර්යාලය ILO, ලෝක සෞඛ්‍ය සංවිධානය WHO, ආහාර හා කෘෂිකර්ම සංවිධානය FAO, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල IFAD, සහ එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය UNESCO යන ආයතනයන් සහභාගීත්වය යන සංකල්පය පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේය. සහභාගීත්ව සංකල්පයේ පුළුල් අර්ථය මතු කර ගනිමින් සහභාගීත්ව සංකල්පය පෙරටු කොට ක්‍රියාකිරීම සඳහා නියමිත ආයතනයක් ද ස්ථාපිත කළේය. ජනප්‍රිය වූ සහභාගීත්ව වැඩසටහන් පර්යේෂණ කිරීමට ශාඛාවක් ද එහි බෙදා වෙන් කළේය. මෙම ආයතනය සහභාගීත්ව ඇගයුම්, සහභාගීත්ව ක්‍රියාමූලික සමීක්ෂණ, සහභාගීත්ව ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සහ සහභාගීත්ව පර්යේෂණ හඳුන්වා දුන්නේය.

## 1.4 සහභාගීත්වයේ අරුත කුමක් ද?

සංවර්ධන වැඩසටහන්වල දී ජනතා සහභාගීත්ව සංකල්පය ඉස්මතුවීම 1970 මුල් භාගයේ සිට වැදගත් සංසිද්ධියක් බවට පත්විය. ද්විපාර්ශවීය සහ බහු පාර්ශවීය බොහෝ ව්‍යාපෘතීන් වල දී ජනතා සහභාගීත්ව සංකල්පය 1980 දී පමණ සිට වැදගත් අංශයක් බවට පත්විය. රාජ්‍ය හා රාජ්‍ය නොවන

සංවර්ධන ව්‍යාපෘති වල විවිධ අවස්ථාවල දී ජනතා සහභාගීත්ව සංකල්පය පුළුල් ලෙස පිළිගෙන ඇත. **'සහභාගීත්ව සංවර්ධන සංකල්පය යටතේ එහි ජනතාව සැළකිය යුතු වන්නේ නොදන්නා සංවර්ධනයක ප්‍රතිලාභ ලබාගන්නා කර්මකාරකයින් වෙනුවට ඔවුන්ගේම සංවර්ධනයේ ක්‍රියාකාරී කොටස්කරුවන් නොහොත් <u>කතෘවරුන් වශයෙන් බව</u>** නාරායන සාමිගේ අදහසක් උපුටා දක්වන චන්ද්‍රසිරි (2002) ප්‍රකාශ කරයි.'

ජනතා සහභාගීත්ව සංකල්පය පිළිබඳව දීර්ඝ පැහැදිලි කිරීමක යෙදෙමින් නානායක්කාර (2006) පහත සඳහන් අදහස් ඉදිරිපත් කරයි. එමගින් ජනතාවගේ සහභාගීත්වය යන්නෙහි අරුත වඩාත් පැහැදිලි කිරීමක් සිදු වී ඇත. 'ජනප්‍රිය' 'පුරවැසි' හෝ ප්‍රජා සහභාගීත්වය හෝ ඊට තුල්‍යාර්ථ සපයන විවිධාකාර අදහස් ජනිත වේ. **'එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ නිර්දේශ වන්නේ සාමාජික රාජ්‍යයන්ගේ ආණ්ඩු විසින් ප්‍රාදේශීය කලාපීය සහ ජාතික සංවර්ධන සැලසුම්වල සමස්ථ විෂය ක්ෂේත්‍රයට ජනතා සහභාගීත්වය ඇතුළත් කළ යුතුව වීම පමණක් නොව ආර්ථික වර්ධනය, සමාජ සමානාත්මතාවය හා පරිපාලන කාර්යක්ෂමතාව සඳහා ද එය අවශ්‍ය වූ අංගයක් බවයි.'** එපමණක් නොව සංවර්ධන ආයාසයට ජනතා දායකත්වය ලබා ගැනුම පහසු කරන ව්‍යුහාත්මක වෙනස්කම් සහ ආයතනික වැඩ පිළිවෙලවල් අඩංගු පියවරවල් ද අනුගමනය කිරීමකි. සංවර්ධනයේ ප්‍රතිලාභ සමාන ලෙස බෙදා ගැනීමට ද එය උපකාරී වේ. මෙවන් කරුණු සම්බන්ධයෙන් ඔවුන් විසින් තීරණ ගැනීමට හවුල්වීම හා මැදිහත්වීම ආර්ථික අභිවෘද්ධිය හා ප්‍රගමනය සඳහා සෘජුව බලපායි නානායක්කාර, වී.කේ. (2006)

දශක තුනක් පුරා දුප්පත්කම සහ සංවර්ධනය අරබයා සහභාගිත්වය යන යෙදුම සාහිත්‍යයේ යොදා ගෙන ඇත. දුප්පත් කණ්ඩායම්වල ශක්තිය, ශක්‍යතාවය, ප්‍රශ්න සමාජයට විශාල ලෙස ඉදිරිපත්වීම, සහතික කිරීමේ අර්ථයෙන් 'සහභාගිත්වය' යන්න වැදගත් සේ පෙනේ. සංකල්පයන් ගණනාවක් සහ ක්‍රමයන් සම්බන්ධව සහභාගිත්ව ප්‍රවේශයන් කාලයක් පුරා සංවර්ධනය වී ඇත. මෙයට හේතුන් ගණනාවක් පවතී.

1. දුප්පකම අඩු කිරීම හා සංවර්ධනයේ අභිමතාර්ථය යන දෙකම දුප්පතුන්ගෙන් බැහැර වූ බලසම්පන්න කණ්ඩායම් වල හා දේශපාලනික කථාවන් හි වැදගත්කමට යටත් වී තිබීම.

2. සුළු ජාතීන්ට, කාන්තාවන්ට, ග්‍රාමීය දිළින්දන් වැනි දුප්පත් ප්‍රජාවට සිදු වූ සංවර්ධනය කාන්දු වීමක් සිදු නොවීම.

3. රජයේ අනුග්‍රාහක සංවර්ධන කාර්යයන් වලදී බලාපොරොත්තු විය හැකි ප්‍රථිඵල සීමිත වීමේ විශාල සැකයේ ප්‍රථිඵලයක් වශයෙන් සීමිත දේශපාලනික සහභාගිත්වය.

ඉහත දක්වන ලද පුළුල් හේතුන් නිසා දුප්පත්කම දුරලීමේ හා සංවර්ධනයේ වර්තමාන තේමාව 'සහභාගිත්වය' යන යෙදුම වී ඇත. උදාහරණයක් ලෙස සමාජ සංවර්ධනය සඳහා වූ ලෝක සමුළුවේ වර්තමාන ක්‍රියාකාරීත්වය හා වැදගත් මූලික සිද්ධාන්තය සහභාගිත්වය යන්න වී ඇත. විශේෂයෙන්ම පාරම්පරික ජනතාව, දුප්පත් කාන්තාවන් වැනි කණ්ඩායම් සඳහා ප්‍රධාන ප්‍රවේශය වශයෙන් සමුළුව මගින් මෙම සංකල්පය පිළිගෙන ඇත.

සහභාගිත්වය යන වදන සමග එයට සම්බන්ධිත සංකල්පයන් වන බලගැන්වීම හා සමාජ සජීවිකරණය යන සංකල්පය සංවර්ධන සාහිත්‍යයේ භාවිතා කොට ඇත. මෙයින් සමහරක් පහත සඳහන් පරිදි වේ.

1. සහභාගිත්ව සංකල්පයේදී දුප්පතා යන්න අදක්ෂයෙක්, අලසයෙක්, අඩු පාඩු ඇත්තෙක්, අළුත් දෙයක් සොයා නොගන්නෙක්, නොසැළකිය යුත්තෙක් හා වංක කෙනෙක් ලෙස සැළකීමක් නැත. නමුත් ජනතාවගේ ශක්‍යතාවයන් සහ ශක්තීන් ඔවුන්ගේ සංවර්ධනය සඳහා යොදා ගැනීමට පුළුවන.

2. සංවර්ධන ක්‍රියාවලියෙන් සංවර්ධනයට අවශ්‍ය ප්‍රථිලාභ අවශ්‍ය ප්‍රමාණයෙන් සහ ද්‍රව්‍යමය සම්පත්, ආර්ථිකමය අවස්ථාවන් සඳහා දුප්පත් ජනයාට ප්‍රවේශයන් සහතික කිරීමේ අදහසක් වශයෙන් ද සහභාගිත්වය යන්න දකින්නේය.

3. ප්‍රධාන ධාරාවන් සමග ඔවුන්ගේ වැඩ කිරීමේ හැකියාව පුළුල් කිරීමෙන් ද ඔවුන් නිෂ්පාදිත අංශයකට ඒකාබද්ධ කිරීමෙන් ද සමාජ සේවාවන් සහ වෙස්කම්වලට ඔවුන්ගේ ප්‍රවේශයන් විවෘත කිරීමෙන් ද සමාජයක අන්ත දුප්පත් කොටස් සමාජයෙන් ඉවත් කිරීමේ මට්ටම අඩු කිරීම අරමුණු කරගත් උපක්‍රමයක් වශයෙන් සහභාගිත්වය දකී.

4. තිරසාර මානව සංවර්ධන වැඩසටහන් වශයෙන් බිම් මට්ටමේ ජනතාවගේ සහභාගිත්වය එයට එකතු කිරීම වැදගත් කොට සැලකෙන්නේය.

කෙසේ වුවද, සහභාගිත්වය යන්න නිතරම අර්ථ දක්වා ඇත්තේ, තොරතුරු ලබාගැනීම හා බෙදා හැරීම, තීරණ ගැනීම, ව්‍යාපෘති යෝජනා සකස් කිරීම දුප්පත්කම අඩුකිරීම අරමුණු කොටගත් ව්‍යාපෘති සැළසුම් කිරීම සහ පරිපාලනය කිරීමට දුප්පතුන් සෘජුව සම්බන්ධ කර ගැනීම ලෙසිනි.

පහත දැක්වෙන ආකාරයේ මට්ටම් දෙකකින් සහභාගිත්වය ලබා ගැනීමට හැකි වේ.

1. ඉලක්ක ප්‍රථිලාභීන් හෝ ප්‍රථිඵලාභී සහභාගිවන්නන්ගේ මට්ටමෙන්
2. ආයතනයන්හි කොටස්කාරයන්ගේ මට්ටමින් උදා: ලෙස රජයේ සාමාන්‍ය සමාජ මට්ටමෙන් සහයෝගය දීම, මහා පරිමානව දුප්පත්කම දුරුකිරීමේ උපායයන්හි ඉලක්ක ප්‍රථිලාභ මට්ටමෙහි ඔවුන්ගේ ක්‍රියාකාරී උද්යෝගී සම්බන්ධවීමේ අවස්ථා දුප්පතුන්ට දෙයි. ඒ සැළසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක වැඩසටහන් ඇගයීමේ ක්‍රියාදාමයේදී ඔවුන්ගේ අදහස්ද සහතික කිරීම හා ඇතුළත් කිරීම හා කිරීමෙනි.

ඉලක්ක ප්‍රථිලාභී මට්ටමේදී ජනතාවගේ සහභාගීත්වය වනුයේ ප්‍රථිඵලය සංවර්ධන වැඩසටහන් සැලසුම් ක්‍රියාදාමයේදී ක්‍රියාත්මක කිරීමේදී සහ ඇගයීමේදී ප්‍රමාණවත් පරිදි මැදිහත්වීමට හා ඔවුන්ගේ අදහස් දැක්වීම පුළුල් ඉඩ ප්‍රස්ථාවක් ලැබීමයි.

සහභාගිත්වය යනු පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක් විසින් හෝ ඔහුගේ හෝ ඇයගේ අයිතියක් තහවුරු කිරීමට උත්සාහ කිරීමේ ක්‍රියාශීලී දාමයකි. සහභාගිවන්නාගේ දැනුවත්වීමේ පිළිබිඹුව ධාවක බලවේගයක් බවට පත්වෙයි. ප්‍රශ්නයකදී ක්‍රියාකාරීත්වයන් සඳහා මේ මාර්ගය හරි දැක්මක් සහිත ඒකාබද්ධතාවයකින් කෙනෙකුගේ පිළිඹිබුව සහ ක්‍රියාව මුදුන් පමුණුවා ගනී. ප්‍රතිරූපය වශයෙන් මානසික ශ්‍රමයේ සියළුම ක්‍රියාවන් මෙහි ඇතුලත් වෙයි. එනම්, සිතීම, තනිව හෝ සමූහ වශයෙන් සිතා බැලීම හෝ සාකච්ඡා කිරීම, විමසීම, පර්යේෂණ කිරීම, විශ්ලේෂණය කිරීම, තේරීම, නිර්ණය කිරීම, සැලසුම් කිරීම ආදියයි.

මෙම අර්ථ දැක්වීමේ අදහස් දෙකක් වේ. පළමුවැන්න සහභාගිත්ව ක්‍රියාවලිය ක්‍රියාකාරී එකකි. පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් සංවිධානය කිරීමේ ක්‍රියාවට පසුව කරනු ලබන සාකච්ඡා පවත්වන්නට දායකවීමයි. දෙවනුව, එය ස්වයං ධාවනකාරී වෙනසකි. ක්‍රියාදාමය හරහා සහභාගීත්වය, ක්‍රියාව, ප්‍රතික්‍රියාව සහ ප්‍රගුණ කිරීම් හරහා සහභාගිත්වය යන Paulo Free (1972) ගේ දර්ශනයයි. මෙමගින් ලැබෙන ආලෝකය වන්නේ සහභාගිත්වය යනු දැන් පවතින තත්ත්වයට අභියෝග කිරීමට දිළින්දන් සවිබල ගැන්වීමයි.

කෙසේ කරන්නේ ද? කුමක් කළ යුත්තේ ද? පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ජනතාව යෙදී සිටීම සහභාගිත්වයට අයත් ය. විවිධ සම්පත් වලින් සම්මාදම් වීමේ තීරණ වලදී සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විශේෂිත සංවිධානයන් හෝ ක්‍රියාකාරකම් වල සහයෝගයක් සංවර්ධන වැඩ සටහන්වල ප්‍රතිලාභ කොටස් ලෙස භුක්ති විඳීමත්, එවැනි වැඩසටහන් ඇගයීම සඳහා වූ උත්සාහයන්ට ඔවුන් සම්බන්ධවීමත් 'සහභාගිත්වය' යන්නට ඇතුලත් වේ (Cohen and Uphoff:1977, පිටුව 30).

මෙම අර්ථ දැක්වීම සහභාගිත්ව ක්‍රියාදාමයේ ප්‍රධාන අංගයන් හතරක් සඳහා ආලෝකය ලබා දේ. එනම් තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ භුක්ති විඳීම හා ඇගයීමයි. මෙය සංවර්ධන ව්‍යාපෘතීන්හි තිරසරභාවය සහතික කරයි.

තීරණ ගැනීමේදී සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දුප්පතුන් සම්බන්ධ වීමෙන්, සමාජ තත්ත්වයන් ඉතා වේගයෙන් මුවහත් වේ යැයි විශ්වාස කරයි යනුවෙන් (Midgley 1986, පිටුව 56) දී ප්‍රකාශ කරයි. ඉහත දක්වන ලද අර්ථකථනයන් හඟවන්නේ දේශීය සංවිධාන සහ ආයතනයන් සහභාගිත්වය ධෛර්යමත් කරමින් අත්‍යවශ්‍ය වැඩකොටසක් ඉටු කරන බවයි.

## 1.5 සහභාගිත්ව ක්‍රියාවලිය

සම්පත් හිඟ ග්‍රාමීය ප්‍රජාව සමඟ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතීන් වලදී පරිසර පද්ධති, සමාජ ආර්ථිකයේ පැටලිලි සහිත තැන් අවබෝධ කර ගැනීමේ අපහසුව ආදී අවස්ථාවලට මුහුණ පෑමට සිදුවන්නේය. එසේම සමාජ-ආර්ථික සංවර්ධන විෂයෙහි වඩා වැදගත් ලෙස සලකන්නේ ග්‍රාමීය ජනයාගේ අවශ්‍යතාවයන් සහ ප්‍රමුඛතාවයන් අනුව ඔවුන් සමඟ සහයෝගයෙන් ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමට එයින් හැකියාවක් ලැබීමයි. ඉලක්ක කණ්ඩායම් සහ සංවර්ධනය පිළිබඳ පහසුකම් සලසන කණ්ඩායම් වල උනන්දුව පහත සඳහන් පැති හතර මත උනන්දු කරන බව මෙම තත්ත්වයෙන් හැඟවෙයි.

ඒවා නම්,

- හැසිරීම්, විශ්වාස සහ හැඟීම් තේරුම් ගැනීම්
- ක්‍රියාත්මක කර ගෙනයාමේ යාන්ත්‍රණය
- අනුගත වී ඇති ප්‍රවේශය හෝ ක්‍රමය
- දෙපක්ෂයේම දැනුම හුවමාරු කර ගැනීම යන ඒවායි.

සංවර්ධනය සඳහා පැමිණි පිටස්තරයාගේ ඉරියව් එම ව්‍යාපෘති පරිසරයට සුදුසු පරිදි හැසිරවිය යුතුය. ඉලක්ක කණ්ඩායමේ ජනයාගේ අවධානය, උනන්දු කරවීම සඳහා ග්‍රාමීය ජනයාගේ හුරුපුරුදු ආදිය තේරුම් ගැනීමට අවශ්‍යය. මෙයින් ඉලක්ක ජනතාව සඳහා නායකත්වයක් මෙන්ම ශක්තියක් නිර්මාණය කිරීම ඉතාම අවශ්‍යය වූවකි. සංවර්ධනය ක්‍රියාත්මක කරන්නන් සහ ප්‍රදේශයේ ප්‍රජාව අතර විශ්වාසයක් නිර්මාණය කිරීමත්, ග්‍රාමීය ප්‍රජාව සමඟ සබඳතා පැවැත්වීමෙන් හා ගොඩ නැංවීමෙන් පහසුකම් සලසන්නාගේ කාර්යය අඛණ්ඩව කළ යුත්තේය. හොඳ මාද්‍ය සම්බන්ධයක් ගොඩනැගීම සඳහා මෙය සුදුසු ක්‍රමයකි. යම්කිසි සංවර්ධන සංසිද්ධියක ප්‍රමුඛතාවයන් කැමැත්ත, පාරම්පරික දැනුම වටහාගැනීමට නිවැරදි තාක්ෂණයක් සහ යන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නේද පෙර සඳහන් කළ පරිදි සහභාගිත්ව හැසිරීම් රටාවකි. ඒකාබද්ධ දැනුම් හා තොරතුරු සම්භාරයක් රැස්කර ගැනීමට වැඩිදුර ඉගෙනීමක් කරන්නට දැනුම හුවමාරු කරගැනීමක් අවශ්‍ය වේ. මේ සඳහා දේශීය ප්‍රජාවගෙන් ඉගෙනීම මහත් උපකාරයකි.

## 1.6 ප්‍රධාන ප්‍රවේශයන්

### 1.6.1 පොදු ජනතාවගේ සහභාගීත්වය

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පිළිබඳ සාකච්ඡාවේදී ප්‍රධාන වශයෙන් සලකන්නේ මිනිස් සිත හෝ මිනිස් ආත්මයයි. වෙනත් වචන වලින් සඳහන් කරන්නේ නම් සංවර්ධන ක්‍රියාවලියේදී තාක්ෂණික හෝ මුදල්මය පැත්තට වඩා වැදගත් වන කාරණය ජනතාවගේ ශ්‍රේෂ්ඨත්වයයි. ශ්‍රේෂ්ඨ මිනිස් සිත සංවර්ධන ප්‍රවේශය තුලින් ව්‍යාපෘතිවල මුදල්මය තත්ත්වය අවම කරන්නේ කෙසේද? සහ ඒවායේ තිරසාර භාවය සහතික කරන්නේ කෙසේද? යන්න පිළිබඳව ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ සමාජ ක්‍රියාකාරියකු වූ Anna Hazare විසින් ලොවට තහවුරු කර තිබේ. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ ඉහලම ප්‍රමුඛත්වය ඉලක්ක කණ්ඩායම් හෝ ජනතාව වෙයි.

### 1.6.2 ජනතාවගේ පාරම්පරික දැනුම

සෑම පුද්ගලයෙකුම උපත ලබා ඇත්තේ යම්කිසි දක්ෂතා කිහිපයක් සමගිනි. අධ්‍යාපනය මෙම දක්ෂතා මුවහත් කරනු ලබන මාර්ගයක් පමණි. වෙනත් වචනවලින් සඳහන් කිරීමේ දී සෑම පුද්ගලයෙකුටම ඔවුන්ගේ අධ්‍යාපනයෙන් ලත් පලපුරුද්දට අයත් දැනුම නැමති මාර්ගය විසින් ලිඛිත හෝ වාචික ස්වරූපයෙන් දැක්වීමට පුළුවන. අකුරු නොදන්නා ගම්වැසියාට ඔහු සතු පාරම්පරික දැනුම ක්ෂණිකව දැක්වීමට පුළුවන්කමක් නොමැති වුවත් කුඩා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේදී තරමක් හෝ පවතින දැනුම වටිනවා මෙන්ම අත්‍යවශ්‍ය වේ. එමනිසා, දේශීය ජනයාගේ දැනුම උකහා ගැනීම වැදගත් පැත්තකි.

### 1.6.3 ගැමි කාන්තාවගේ සහභාගීත්වය

සහභාගිත්ව සංවර්ධන සංදර්භයේදී අව්‍යාජ දැනුම පෝෂණය කිරීම සහ කාන්තාවන් බලගැන්වීම අප්‍රතිහතව කරගෙන යාම ඉතාම වැදගත් කාරණයකි. සංස්කෘතියේ හා සම්ප්‍රදායේ මුල් නිසා කාන්තාව සතුව පවතින දැනුම භාවිතයට ගැනීම යම්කිසිවක් නොපසුබටව කරගෙන යාමේ ශක්තිය හා කළමනාකරණ දක්ෂතාවය ඉදිරියට නොපැන සැඟවී පවතී. එබැවින් කාන්තාවන් අතරෙහි අප්‍රකටව පවතින දක්ෂතා ග්‍රහනයට ගැනීම අත්‍යාවශ්‍යය. එනම්, සහභාගිත්ව සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමක් වන්නේය.

## 2. ක්‍රියාබද්ධ පර්යේෂණ යනු කුමක්ද?

ක්‍රියාබද්ධ පර්යේෂණ යනු ක්‍රමවත් අධ්‍යයනයන් වේ. ක්‍රියාත්මක වැඩසටහනක දී නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් මතුවන ප්‍රතිඵලයේ ප්‍රතිපෝෂණය සෘජුව සහ ඉතා ඉක්මණින් ලැබීම නිසා මෙහෙයුම් කාර්ය මණ්ඩලයට සිය මෙහෙයුම් කාර්යක්ෂමව කිරීමට සහ වැඩිදියුණු කිරීමට උදව් වෙයි. (Bower, 1977 පිටුව 20)

ක්‍රමවත් අධ්‍යයනයක් සමග බැඳුනු ක්‍රියාත්මක වැඩසහනක ප්‍රතිඵලයේ ප්‍රතිපෝෂණය එහි මෙහෙයුම් කාර්ය මණ්ඩලයට සෘජුව හා ක්ෂණිකව එම කටයුතු සඵලදායක ලෙස වැඩිදියුණු කිරීමට උදව් වෙයි. (Veerma *et.al* 1973,පිටුව 21)

සමාජ තත්ත්වය දියුණු කිරීමට සහ වෙනස් කිරීමට ඇතැම් සමාජ විද්‍යාත්මක පර්යේෂණ පොළඹවනු ලබයි. ක්‍රියාබද්ධ පර්යේෂණයේ අරමුණ තොරතුරු එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම පමණක් නොව ප්‍රායෝගික වෙනසක් ඇති කිරීමයි (Watson *et.al*, 1972, පිටුව 21).

ක්‍රියාබද්ධ පර්යේෂණ මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා ඉක්මන් සහ සෘජු ප්‍රතිපෝෂණයක් ලබාගන්නා බව මෙම අර්ථ දැක්වීම් පෙන්වා දෙයි. මෙය ඉතාම සඵලදායි මෙහෙයුමක් ලබාගැනීමට උපකාර වන අතර සමාජමය වෙනසක් ඇති කිරීමට ප්‍රායෝගික කර්තව්‍යයක් කරයි. එසේම පවත්නා සම්පත් දැනුම මට්ටම, පාරම්පරික සිතුම්-පැතුම් හා සංස්කෘතිය වැනි අදාළ ප්‍රදේශයේ ජනතාව පිළිබඳ පසුබිම් තොරතුරු ලබා ගැනීමට උත්සාහයක් දැරීමට ක්‍රියාබද්ධ පර්යේෂණ අත්‍යවශ්‍ය වන්නේය.

ක්‍රියාබද්ධ පර්යේෂණයේ ක්‍රියාකාරිත්වය වන්නේ පහත සඳහන් කරුණුය.

1. ඉලක්ක කණ්ඩායම ප්‍රත්‍යක්ෂ ලෙස හඳුනා ගැනීම
2. ඔවුන්ගේ ප්‍රශ්න, අවශ්‍යතා සහ ප්‍රමුඛතා තීරණය කිරීම
3. ජාත්‍යන්තර සංවර්ධන අර්ථ දැක්වීම් මත ඔවුන්ගේ වර්තමාන දැනුම, හැඟීම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තක්සේරු කිරීම
4. නව සංකල්පයන් සඳහා ප්‍රතිචාරය දැක්වීමේ ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්හි ජනතා සහභාගිත්ව සංකල්පය පිළිබඳ ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම සඳහා කැලේගම කුඩා වැව් පුනරුත්තාපන ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. මෙහි ප්‍රායෝගික අත්දැකීම් ආශ්‍රයෙන් ජනතා සහභාගීත්වයට බලපාන සාධක පිළිබඳ සමාලෝචනයක් මෙතැන් සිට සිදු කෙරේ.

## 3. ව්‍යාපෘතියේ පසුබිම පිළිබඳ විස්තරයක්

### 3.1 වියලි කලාපයේ තත්ත්වය

#### 3.1.1 සාමාන්‍ය තත්ත්වය

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි නිවර්තන දේශගුණයකින් යුක්ත දූපතකි. මෙය උත්තර අක්ෂාංශ 6ත් 10ත් අතර පිහිටා ඇත. මධ්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 27.5 කි. මෙහි වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර 225 කි. මහද්වීපික බලපෑම නිසා උෂ්ණත්වය අඩු වී ඇත. මධ්‍යම කඳුකරයේ සීතල දේශගුණයක් පවතින අතර එහි මධ්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 18 කි (ශ්‍රී ලංකා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 1995). රට තුළ පවතින උන්නතාංශය, උෂ්ණත්වය හා වර්ෂාපතනය මත විවිධ වූ නිවර්තන දේශගුණයන් රඳා පවතී. රටෙහි ප්‍රධාන වර්ෂාපතන කලාප තුනක් පවතී. එනම් සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 1,875 - 2,500 අතර වූ තෙත් කලාපයේම කොටසක් වූ අන්තර කලාපය, සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 1,250 - 1,875 අතර වූ වියළි කලාපය හා සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 1,250 ට අඩු වූ වියළි කලාපයේම කොටසක් වූ ශුෂ්ක කලාපය වශයෙනි.

ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණෙන විටත්, වසර 1500 ක පමණ ශිෂ්ටාචාරයක් ශ්‍රී ලංකාවේ පැවතිණි. ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණ ශතවර්ෂ කිහිපයකින් වියළි කලාපය ඉතා සාරවත් දේශයක් බවට පත්කර ගත හැකි විය. ඉතා විශිෂ්ට වාරිමාර්ග පද්ධතියක් ගොඩනගා ශෂ්‍ය බෝග වගාවට ජලය සපයා ගතහැකිවීමෙන් මෙය මෙසේ සිදුවිය. ඇතැම් වාරිමාර්ග ඇලවල් සැතපුම් ගණනක් දිග වූ අතර ජලය ඒකරාශී කිරීමට ඉදිකළ වැව් මුහුදු මෙන් දර්ශනය විය. ඉංග්‍රීසි ජාතික (Clerk 1972, පිටුව 5) මේ පිළිබඳව විවරණයක යෙදෙමින් ප්‍රකාශකර ඇත්තේ "නවීන විදුලිබල ජලාශවල ක්‍රියාත්මක වන සොරොව් දොරවල් මහා බ්‍රිතාන්‍යයට සීසර් පැමිණීමටත් පෙර ශ්‍රී ලංකාවේ වැව් කර්මාන්තයේ දී ශිලින් නෙලා ඇත". යනුවෙනි.

අනුරාධපුර හා පොළොන්නරු සිංහල රාජ්‍ය යුගයන්හි දී රජුගේ ප්‍රධානම කාර්යයක් වූයේ කෘෂිකාර්මික කටයුතු සඳහා පහසුකම් සැලසීමයි. වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම සඳහා ඉතාමත් අවශ්‍ය වන්නේ ජලයයි. මෙම අවශ්‍යතාවය සපුරාලනු සඳහා වියළි කලාපය පුරාම වැව් සහ ඇලවල් ඉදිකර ඇත. අබේරත්න (1985) ට අනුව ගම්වැව් 12,500 පවතී. අනුරාධපුර රාජ්‍ය සමයේ වැව් සහ ඇලවල් ගණනාවක් ඉදිකල රජවරුන් කිහිපදෙනෙක් සිටියි. වසභ රජු, ධාතුසේන රජු, මහසෙන් රජු මේ අතුරින් ප්‍රධානවේ. පොළොන්නරුව යුගයේ දී ද, මෙවැනිම රජවරුන් කිහිපදෙනෙකු හමුවේ. මහා විජයබාහු සහ පරාක්‍රම බාහු මේ අතුරින් කැපී පෙනේ. මෙයට අමතරව ඇමතිවරුන්, ප්‍රාදේශීය නායකයින් තමන්ගේ ප්‍රදේශවල වැව් සහ ඇලවල් ඉදිකර ඇත.

ක්‍රි.ව. 13 වන සියවසේදී රජරට රාජධානිය පරසතුරු උවදුරු සහ ලෙඩරෝග ආදිය නිසා බිඳ වැටුණේය. සිංහල රාජධානිය නිරිතදිග ප්‍රදේශයට සංක්‍රමණය වූ අතර වියළි කලාපය ජන ශූන්‍ය ප්‍රදේශයක් විය. රාජධානිය නිරිත දිගට සංක්‍රමණය වී, තෙත් කලාපය ජනාකීර්ණ වූ අතර වියළි කලාපයේ ඉතා අඩු ජනගහනයෙන් යුත් කැලෑබද හුදෙකලා ගම්මාන කිහිපයක් පමණක් ඉතිරි විය. මේ ආකාරයට වසර 700 කට කිට්ටු කාලයක් අතිශය දුප්පත්, මැලේරියා වැනි වසංගත වලින් යුත්, මන්දපෝෂණය පැතිරී පැවති අතිශය කටුක ජීවිත ගත කරන ජනගහනයකින් හෙබි ගැමි ජනතාවකගෙන් යුක්ත වූ ගම්මාන වියළි කලාපයේ පැවතිණි.

සුප්‍රසිද්ධ ඉංග්‍රීසි ලේඛකයකු වන Leonard Wolf ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජන ජීවිතය අළලා රචනා කරන ලද කෘතියක් වන Village in the Jungle නම් කෘතියේ එවැනි ගමක් පිළිබඳව කරන විවරණය මෙහිලා දැක්වීම සුදුසු ය.

'මගේ දරුවන්ගේ පියා වන පොඩි සිංඤ්ඤෝ මෙසේ පැවසුවා. ගෙදර කුරක්කන් ටිකක්, මෙනේරි ටිකක්, වට්ටක්කා ගෙඩියක් නෑ. ඒ විතරක් නෙමෙයි, ලුණු කැටයක්වත් නැහැ. දින තුනක් තිස්සේ මම කැළෑකොළ හැර වෙන කිසිදෙයක් කෑවෙ නැහැ. මැගේ පියයුරුවල මගේ ළමයින්ට කිරි නැහැ. මම ඇඳිලා-පැදිලා ගිහින්. අගෝස්තුවේ වැසි එනවා නේද? ඔහු ඇසීය. ජූලි වල කුරක්කන් පිටි මට දෙන්න පුළුවන් වෙයිද? වහගනින් උඹේ කට. උඹ මෝඩයෙක් අගෝස්තු මාසේ කියන්නේ ළමයි මැරෙන මාසේ.'

ඉතා අඩු සෞඛ්‍ය පහසුකම් මත කටුක දිවියක් වියළි කලාපයේ වැසියෝ ගත කලෝය. දේශගුණික තත්ත්වය සෑම පවුලකම අඩු ආදායම් තත්ත්වයක් ඇති කිරීමට හේතු විය.

තෙත් කලාපයේ පවතින ජනගහන තදබදය අඩු කිරීම සඳහා වියළි කලාපයට හොඳ හැකියාවක් තිබේ. අනාගත සංවර්ධන කටයුතු සඳහා ඉඩම් එහි ඇත. 1953 ලංකාණ්ඩුවේ වාර්තාව හෙළිකල පරිදි වියළි කලාපයේ අනාගත සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉඩම් අක්කර මිලියන 3 කට වඩා පවතී. ආර්ථික හා සමාජික වශයෙන් මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා මානව සහ ද්‍රව්‍යාත්මක සම්පත් යෙදීම අවශ්‍ය වෙයි.

1940 ගණන් වල සිට ජනපද යෝජනා ක්‍රම ආරම්භ කොට ජනගහන තදබදයක් සහිත තෙත් කලාපයේ ජනතාව මෙම ප්‍රදේශයට සංක්‍රමණය කරවීමෙන් සහ මැලේරියා උවදුර ඉවත් කිරීමෙන් වියළි කලාපය සංවර්ධනය කිරීමේ උත්සාහය ආරම්භ විය.

වියළි කලාපීය ගැමි ජනතාවගේ ප්‍රධානතම ජීවනෝපාය වූ වී හා වෙනත් බෝග වගාවන් සඳහා ඉඩම් වැඩි ප්‍රමාණයක් වෙන් කිරීම පිණිස ජනතාවගේ ජීවත්වීම සඳහා පිහිටුවාගෙන තිබූ ගම කුඩා ප්‍රදේශයක් විය. මේ පිළිබඳව අදහස් දක්වන වික්‍රමතිලක මහතා 1963 දී අදහස් දක්වා ඇත්තේ මෙසේය.

"වාරිමාර්ග වී වගාව සඳහා උපරිම ඉඩම් ප්‍රමාණයක් ලබා දීමට හැකි කරනු පිණිස වැවට පහළින් පිහිටි කුඩා ප්‍රදේශයක ගම්වැසියන් තදබද වී එක ගොඩෙහි ජීවත් වී ඇත. කුඩා වැවෙහි සීමිත ජල සැපයීම නිසා එකිනෙක ළඟින් ගෙවල් ගොඩනංවාගෙන ජීවත් වීම ඉතා සුදුසු ක්‍රමයක් විය".

වියළි කලාපයේ ශක්‍යතාවය සඳහා කරුණු ගණනාවක්ම බලපා තිබේ. කුඹුරු ඉඩම් ප්‍රමාණය මේ අතින් ඉතාම වැදගත් ය. ශ්‍රී ලංකාවේ වී වගාව සිදුවන්නේ කුඩා ඉඩම් කැබලි වශයෙනි. 1958 කුඹුරු පනත අනුව ශ්‍රී ලංකාවේ කුඹුරු ඉඩම් සියල්ලෙන්ම 85 ප්‍රතිශතයකට කිට්ටු ප්‍රමාණයක් අක්කර 2 ට වඩා අඩු ඉඩම් විය. කුඹුරු ඉඩම් වලින් සියයට 60 අක්කර 1 ට අඩු ඒවා විය. සියළුම ඉඩම් වගා කරන්නා සතු නොවේ. අඳගොවීන් විසින් ද වගා කරනු ලබයි. වගා කන්නයක් අවසානයේ අඳ ගොවියා ඉඩම් හිමියාගේ කොටස දෙනු ලබයි. අස්වැන්නෙන් භාගයක් දීමේ සහ කාලක් දීමේ ක්‍රමය වශයෙන් අඳ ක්‍රම දෙකක් පවතී. වියළි කලාපයේ වර්ෂාපතන රටාව අනුව, වසරකට කන්න දෙකක් වගා කිරීමට නොහැකිය. එසේ කළ හැක්කේ මහා වාරිමාර්ග යටතේ වූ වගාබිම් පමණි.

වියළි කලාපීය ගොවියාට වගාවේදී බලපාන වෙනත් සාධක කිහිපයක් ඇත. මුදල් හිඟවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා අවශ්‍ය යෙදවුම් ලබාදීමට නොහැකි වුවහොත් වගාව සීමිත වෙයි. වී වගාවේදී සියළුම යෙදවුම් නියමිත කාලයේදී යෙදීම අත්‍යවශ්‍යය.

කුඹුරු බිම් සී සැමත් සමඟ ජලය සැපයීම අවශ්‍ය වෙයි. ගොවීන් විසින් ට්‍රැක්ටර් සහ මී ගවයන් කුලියට යොදා සී සෑම් කරනු ලබයි. ඇතැම් ගොවීන් තෙත් කලාපයේ කොන්ත්‍රාත්කරුවන් යොදා ගනී. ගමේ සෑම කෙනෙක්ම උත්සාහ කරන්නේ නියම කලට වගා කිරීමට බැවින් ට්‍රැක්ටර් සහ මී ගවයන් සඳහා ඒ සැමගෙන් එකවිට ඉල්ලුමක් ජනිත වන බැවින් එහි ප්‍රතිඵලය වන්නේ බිම් සැකසීමේ වියදම ඉහළ යාමයි. ප්‍රාග්ධන අපහසුතා හෝ පොහොර හා කෘමිනාශක යෙදීමේ අවබෝධයේ අඩුකම මත අවසාන ප්‍රතිඵලය වන්නේ අස්වැන්න අඩු වීමයි.

ගොවි ජනතාවගේ වගා සීමා කිරීමට බලපාන අනෙක් සාධකය වන්නේ ඉඩම් කැබලි වී යාමයි. මෙම ඉඩම් කැබලි වී යාමේ අයහපත් ප්‍රතිඵලය වන්නේ එක් කුඩා වැවක තැන් කිහිපයක ඉඩම් කැබලි කිහිපයක් තිබීම සහ වැව් කිහිපයක් යටතේ කුඩා ඉඩම් කැබලි කිහිපයක් පැවතීමයි. මෙවැනි හේතු සාධක එකක් හෝ කිහිපයක් නිසා ඇතැම් වගා කන්නවල කුඩා වාරිමාර්ග යටතේ වූ වගා බිම් වලින් තුනෙන් එකක් පමණ වගා කර නැත. මේ හේතු නිසා ඔවුහු හේන් වගාව දෙසට යොමු වෙති.

හේන් වගාවේ නියැලීම යනු කැලෑවෙන් කොටසක් කපා පුළුස්සා ශුද්ධ කර එහි කව්පි, මුං වැනි වෙනත් බෝග සහ ධාන්‍ය වර්ගත්, එළවළු බීජත් වැපිරීමයි. මෙම බෝග සඳහා වී වලට මෙන් ජලය අවශ්‍ය නොවේ. එසේම බොහෝ යෙදවුම් අවශ්‍ය වන්නේ ද නැත. කපන ලද කැලෑව පිලිස්සීමෙන් ස්වභාවිකවම මෙහි පස සාරවත් වීම මත ගොවීන්ගේ සාර්ථකත්වය රඳා පවතී.

එක ගොවියෙකු වගා කරන වපසරිය තීරණය වන්නේ ඉඩම් වල සුලභතාවය සහ ඒවා සංවර්ධනය කිරීමට ඔහුට ඇති හැකියාව මතයි.

හේන් වගාව සඳහා සීමාවන් කිහිපයක් පවතී. හේන් වගාව පාංශු ඛාදනයට සහ ප්‍රදේශයේ පරිසරය විනාශ වීමට හේතු වෙයි. මේ පිළිබඳ Myradal (1967, පිටුව 9) මෙසේ අදහස් දක්වා ඇත. ජනගහන වර්ධනය වීම නිසා ගසක ආයු කාලය අඩු වී ඇතැයි වාර්තා වී ඇත. එනම් වසර 15-20 ප්‍රමාණය වසර 8-10 දක්වා ය. ඇතැම් විශේෂඥයන් දක්වන පරිදි වනාන්තර කැපීමේ අඩුම කාලය වසර 20-30 අතර වෙයි. එසේ වුවහොත් පාංශු ඛාදනය සඳහා බලපෑම මගහැරවිය හැකි වේ.

වියළි කලාපීය කෘෂිකර්මය කාලීනය. වගා කළ හැක්කේ වසරේ නියමිත මාස ගණනාවක් පමණි. ගොවිපළ නොවන රැකියා අවස්ථාවන්හි නියැලීමට ඔවුන්ට අවස්ථාවක් නැත. මේ නිසා වියළි කලාපයේ ඕනෑම ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක ප්‍රධාන කොටස කෘෂිකර්මය විය යුතු වේ.

ඉහත සඳහන් කරන ලද හේතු සාධක නිසා යැපුම් කෘෂිකර්මයක නියැලී සිටින වියළි කලාපීය ග්‍රාමීය ගොවි ජනතාව සඳහා ඉහළ ජීවන මට්ටමක් ළඟාකර ගැනීම අපහසු වී ඇත. ඔවුහු අඩු ආදායම්, අඩු ප්‍රාග්ධන යෙදවීම් හා අඩු නිෂ්පාදනය නිසා දුප්පත්කම නැමැති විෂම චක්‍රයේ සිරවී සිටිති.

## 3.1.2 සමාජ තත්ත්වය

වියළි කලාපීය ජනතාවගේ ආර්ථික පසුබිම විසින් ඔවුන් සමාජීය වශයෙන් පසුගාමී බවට පත්කර තිබේ. වියළි කලාපය පිහිටා ඇත්තේ රටේ ප්‍රධාන පාලක මධ්‍යස්ථානයේ සිට බොහෝ දුරස්ථවය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වසර ගණනාවක් පුරා වියළි කලාපය කැපී පෙනෙන වෙනසකට භාජනය වූයේ නැත. ඔවුන් යැපීම් මානසිකත්වයක් සහිත ජනතාවක් බවට පත්විය. පවුලක සාමාජිකයන්ගේ සාමාන්‍යය තරමක් විශාල විය. ජනතාව විසින් නායකත්වය දී සිදුකරන ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා උනන්දුව අඩු අතර ඔවුන් තුළ ක්‍රියාකාරී සමාජ සජීවීකරණයක් ද නැත. මෙවැනි දරිද්‍රතාවයකින් යුත් කටුක පරිසරයක ජීවත්වන ප්‍රජාවන් පිළිබඳව විවරණයක යෙදෙන Galbraith (1968,පිටුව 11) මෙසේ ප්‍රකාශ කර සිටී.

මුළු සමාජයේ ඉතා වැදගත් කාර්යයක් කුලය විසින් තවදුරටත් කරනු ලබයි. (Kaech : 1968, පිටුව 11) වියළි කලාපය පුරාම ජනතාවගේ ස්වභාවය එක හා සමාන බවක් දරයි. සෑම පවුලක්ම තමාගේ කුඩා කුඹුරු ඉඩම හෝ හේන වගා කරයි. ජනතාවගේ ඇඳුම්-පැළඳුම්, අධ්‍යපනය හෝ ජීවිතයේ තත්ත්වය ද එකිනෙකට බොහෝ සමානය. ගමේ සමාජ නායකත්වය සාමාන්‍යයෙන් දරන්නේ පාසැල් ගුරුවරයා, වෙද මහතා හෝ එවැනි වෙනත් පිටතින් පැමිණි පුද්ගලයෙකු විසිනි. ඇතැම් විට ඔවුන් පිටස්තරයන් නොවන්නේය. එහෙත් ගමෙහි අඛණ්ඩව ජීවත් වන්නවුන් නොවේ. ඔවුන් සිය රාජකාරි සඳහා අදාල ගමෙන් ඉවත් වී ගිය විට එම තැනට ගම්වැසියන් ද පත් වේ.

## 3.1.3 වියළි කලාපයේ වර්තමාන තත්ත්වය

වියළි කලාපය වෙත ගංගා හැරවීමෙන් ඇති කරන ලද නව ජනපද යෝජනා ක්‍රම වියළි කලාපයේ නව කාලපරිච්ඡේදයක් ආරම්භ කිරීමට සමත් විය. මහවැලි යෝජනා ක්‍රමය යටතේ අක්කර නව ලක්ෂයකට වඩා සංවර්ධනය කළේය. වගා කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩම් නොමැති පවුල් තුන් ලක්ෂයකට වඩා මේ යටතේ පදිංචි කරන ලදී. තවදුරටත් මෙවැනි විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම වියළි කලාපය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ හැර දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්; ගම් උදා වැඩසටහන් ආදිය විසින් වියළි කලාපයේ මහාමාර්ග, විදුලිය, ප්‍රවාහන පහසුකම්, වෙළෙඳපොළ පහසුකම්, කෘෂිකාර්මික සේවා සැපයුම් මධ්‍යස්ථාන, සෞඛ්‍ය පහසුකම් මධ්‍යස්ථාන, අධ්‍යාපන මධ්‍යස්ථාන වැනි යටිතල පහසුකම් සැපයීම කරගෙන යනු ලබයි.

ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවලට හසු නොවූ ඒවායේ ප්‍රතිලාභ නොලැබුණු වර්ෂාපෝෂිත පැරණි වැව්ගම් විශාල ප්‍රමාණයක් තවමත් පවතී. මෙම ගම්වල ජනතාව වර්ෂාපෝෂිත කුඩා වැව හා ඒ ආශ්‍රිත කුඹුරු සහ හේන් වගාව, ගව පාලනය යන පාරම්පරික කෘෂි කටයුතු වල නියැලෙමින් සමාජ ආර්ථික මට්ටමෙන් ඉතා පහළ මට්ටමක ජීවත් වෙති.

නමුත් මෙම ගම්මාන සඳහා ද සමාජයේ අවධානය යොමු කළ යුතු අතර ඒවායේ ජනතාව ද සමාජ ආර්ථික අංශයෙන් සංවර්ධනය කළ යුතු වේ. මෑතක දී ස්ථාපනය කරන ලද ආහාර භෝග නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් මෙවැනි පාරම්පරික ගම්මාන සංවර්ධනය කිරීමේ වැදගත්කම පෙන්වා දී ඇත.

අනුරාධපුර, හම්බන්තොට වැනි වියළි කලාපීය බොහෝ ග්‍රාමීය ප්‍රජාවගේ පාරම්පරික කෘෂි පාරිසරික පද්ධතිවල ඒකාබද්ධතාවයක් නොමැතිකම සමග විශේෂ ලක්ෂණයක් දැකිය හැකිය. මෙය අදාළ ප්‍රජාවගේ දියුණුව සහ සංවර්ධනය අකර්මන්‍ය සහ විශාල වශයෙන් අනතුරුදායක බවට පත් කිරීමට හේතු වී තිබේ. මෙම තත්ත්වය විශේෂයෙන්ම කුඩා වැව් සම්බන්ධයෙන් දැකිය හැකි සත්‍යයකි. එම ප්‍රජාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා ජීවිතයේ වෙනත් සියළුම අවශ්‍යතා පෝෂණය කිරීමේදී ඔවුන්ගේ ඉරණම රඳා පවතින්නේ මෙම කුඩා වැව මතයි. එසේ වන්නේ ප්‍රජාවගේ ප්‍රධානතම ආදායම් මාර්ගය සහ ජීවනෝපාය කෘෂිකර්මය හෙයිනි.

පැවති වාරිමාර්ග පද්ධති පිරිහී යාමෙන් වාරිමාර්ග ජල පහසුකම් මත පදනම් වූ කෘෂිකර්මය කරගෙන යාම අපහසු කටයුත්තක් වී ඇත. එම නිසා, බොහෝ ගොවියන්ගේ ජීවනෝපාය හේන් වගාව මත රඳා පවතී. එම තත්ත්වය වර්ෂාපෝෂිත වැව් යටතේ ජීවත්වන්නවුන්ගේ ජීවිත ඉතා පහත් මට්ටමක පත් කර තිබේ. එම නිසා රජයෙන් යම්කිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම් එය මෙම ප්‍රජාවගේ ආදායම් තත්ත්වය හා ජීවන මට්ටම උසස් කරලීමේ අර්ථාන්විත වැඩපිළිවෙලක් විය යුතු බවට සැකයක් නැත (ආහාර නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත වීම සඳහා වූ ජනාධිපති කාර්යය සාධන බලකාය, ශ්‍රී ලංකාව, 1996, පිටුව 12).

## 3.4 කැලේගම ව්‍යාපෘතියේ පසුබිම

### 3.4.1 වැව් පුනරුත්ථාපන වැඩසටහන

කැලේගම වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතිය ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් දියත් කරන ලද අත්හදා බැලීමකි. වයඹ පලාතේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලේගම ග්‍රාම සේවක වසමේ පිහිටි කුඩා වැව් 5ක් මෙම ව්‍යාපෘතිය මඟින් ආවරණය කරයි. ඒවානම් පාළුගම, කැලේගම, පුපුලැටිය හපුකුඹුර සහ ඉහළගමයි.

කුරුණෑගල, අනුරාධපුර මහා මාර්ගයට වයඹ දෙසින් සහ ගල්ගමුව නගරයට කි.මී. හතරක් දුරින් මෙම කැලේගම ව්‍යාපෘතිය පිහිටා තිබේ. කැලේගම කුඩා වැව් නවීකරණය කිරීමේ සැළැස්ම සහ ඒ සඳහා ඇස්තමේන්තු කර තිබු වියදම් වගු අංක 01 න් දැක්වේ.

වගුව - 01 : පුනරුත්ථාපන ඇස්තමේන්තුව

| කාර්යය | වියදම රු. |
|---|---|
| වැව් 5 වැඩිදියුණු කිරීම | 1,968,497 |
| ජල කලමනාකරණය | 175,000 |
| පසු විපරම් කිරීම හා ඇගයීම | 1,95,000 |
| නවීකරණය කිරීම | 250,000 |
| සැළසුම් නිලධාරීන් සඳහා වියදම | 388,000 |
| ජනසවිය භාරකාර මුදල සඳහා ගාස්තු | 372,000 |
| මුළු වියදම | 3,348,854 |

*මූලාශ්‍රය: ව්‍යාපෘති වාර්තා: ගො.ප.පු.ආ. (1992)*

මූලික විමර්ශන අවධියේදී සැළසුම් කිරීමේ කාර්යය සඳහා සෑම එක් එක් වැවක් පිළිබඳව තොරතුරු එකතු කලේය. එක් එක් වැවක් පිළිබඳව තොරතුරු මෙහි පහත දක්වා ඇත.

1. **කැරල්ගම වැව**

| | |
|---|---|
| පවුල් සංඛ්‍යාව | 14 |
| වාරි ජල සම්පාදනය කළහැකි අක්කර ප්‍රමාණය | 31 (අක්කර) |
| වම් ඉවුර සොරොව්ව | සොරොව්වට හානි වී ඇත. නව ඉදිකිරීමක් අවශ්‍ය වේ. |
| වම් ඉවුර වාන | ස්වාභාවික වාන් මගකි. මෙම ජලය නෙල්ලිමඩුව ඇලට ගොස් එය පහළ දී රාජාංගනය වැවට ගමන් කරයි. |

2. **පාළුගම වැව**

| | |
|---|---|
| පවුල් සංඛ්‍යාව | 48 |
| වාරි ජලය සම්පාදනය කළ හැකි අක්කර ප්‍රමාණය | 21 (අක්කර) |
| වැවෙහි ගැඹුර | අඩි 12 |
| නාන තොටුපළ | 01 |
| ප්‍රධාන සොරොව්ව | අඩි 4 විශ්කම්භයක් සහිත කොන්ක්‍රීට් බටය සොරොව්ව සඳහා සුළු අළුත්වැඩියාවක් අවශ්‍ය වේ. |
| වාන් මාර්ගය | ස්වාභාවික මගකි. අඩි 30ක් දිගය. වසර 10 ක සිට පමණ අක්‍රියව පවතී. |

3. **පුපුලැටිය වැව**

| | |
|---|---|
| වාරි ජලය සම්පාදනය කළ හැකි අක්කර ප්‍රමාණය | 46 (අක්කර) |
| සොරොව් සංඛ්‍යාව | 03 නව සොරොව් සහ සොරොව් දොරවල් අවශ්‍ය වේ. |
| වාන් මාර්ගය | ස්වාභාවිකයි. වැඩිදියුණු කිරීමක් අවශ්‍යයි. |

4. **හපුකුඹුර වැව**

| | |
|---|---|
| පවුල් සංඛ්‍යාව | 45 |
| වාරි ජලය සැපයිය හැකි අක්කර ප්‍රමාණය | 29 (අක්කර) |
| දකුණු ඉවුරේ සොරොව්ව | අක්‍රියයි. නව සොරොව්වක් ඉදිකිරීම අවශ්‍යවේ. |
| වාන් මාර්ගය | ස්වාභාවිකයි. අඩි 40 දිගය. |

5. **ඉහළගම වැව**

| | |
|---|---|
| පවුල් සංඛ්‍යාව | 41 |
| වාරි ජලය සැපයිය හැකි අක්කර ප්‍රමාණය | 11 (අක්කර) |
| දකුණු ඉවුර සොරොව්ව | අක්‍රියයි. නව ඉදිකිරීමක් අවශ්‍යයි. |
| දකුණු ඉවුර වාන් මාර්ගය | ස්වාභාවිකයි. මෙම වානෙන් ජලය ගලා යන්නේ කුඹුරු හරහා බැවින් ඒවා පුරන්වී පවතී. නව වාන් මාර්ගයක් ඉදි කිරීම අවශ්‍ය වේ. |

***මූලාශ්‍රය: ව්‍යාපෘති වාර්තා, ගො.ප.පු.ආ. (1992)***

## 3.5 තෝරා ගැනීමේ නිර්ණායක

මෙයට ඉහත දී සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක නොවීමේ විශේෂිත හේතුව මත ඉහත සඳහන් කරන ලද වැව් පහ නවීකරණ වැඩසටහන සඳහා තෝරා ගැණිනි. ගම් වැසියන් සඳහන් කරන ආකාරයට පසුගිය වසර 60 ක කාලයේදී ඔවුන් දුටු එකම ව්‍යාපෘතිය මෙයයි. ගම්වාසීන් මුහුණදෙන ඉතාම අමාරු ප්‍රශ්නය උග්‍ර ජල හිඟයයි. ප්‍රමාණවත් ජල ධාරිතාවක් නොමැතිව අවම වශයෙන් මාස් කන්නයේදීවත් මෙම ගොවීන්ට හොඳ අස්වැන්නක් ලබා ගැනීමට නොහැකිය. මෙම වැව් සඳහා ක්‍රමවත් ජල සැපයුමක් නොපවතී. ඒවා වර්ෂාපෝෂිතය. පෝෂිත ප්‍රදේශයේ සීඝ්‍ර වන විනාශයත් සමගම වියළි කාලගුණ තත්ත්වයක් පවතින කාල පරිච්ඡේදයේ දී ජල වාෂ්පීකරණය ඉතා ඉහළය. වැව් ඉස්මත්තේ වූ පෝෂිත ප්‍රදේශයේ පාංශු ඛාදනය ද අධිකව සිදුවන බැවින් සෑම වැවක්ම රොන් මඩ වලින් පිරී තිබේ. මෙම සියළුම සාධකවල ප්‍රතිඵලය වී ඇත්තේ සෑම වැවකම ජලය රඳවා ගැනීමට හැකියාවක් නොවීම නිසා ජල හිඟතාවයයි. මාස් කන්නයේදී වැව පූර්ණ වශයෙන් පිරියන තුරු ගොවීන් ඉඩම් සකස් නොකිරීම සාමාන්‍ය ක්‍රමයයි. මෙම පුරුද්ද යම් තරමක ජලය ගොවීන්ට අහිමි වී යාමට ප්‍රධාන හේතුවක් වී තිබේ. ගොවීන් පවසන ආකාරයට ඇතැම් වගා කන්න වල තත්ත්වය වන්නේ ඔවුනගේ වගාව ද විනාශවන අතර ගෙදරදොර කටයුතු හා ස්නාන කටයුතු සඳහා ද ජලය නොමැති වීමයි. ප්‍රදේශයේ ගව පාලනය සඳහා ශක්‍යතාවයක් පැවතියද මෙවැනි කටයුතු සඳහා ගොවීන් මැලිකමක් දක්වන්නේ ගමේ වැවෙහි ජල තත්ත්වය පිළිබඳව විශ්වාසයක් නොමැති නිසාවෙනි. මෙයට අමතරව ගවයන්ට කෑවීම සඳහා තණ පිටි ද ගමෙහි නැත.

ඉහත විශ්ලේෂණය අනුව, මෙම ගමෙහි සියළුම ආර්ථික කටයුතු සිදුවනුයේ වාරිමාර්ග කෘෂිකර්මය කේන්ද්‍රකොට ගෙනය. එම නිසා, මෙම තත්ත්වය විමසා බැලූ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ජල හිඟතාවය මත ඇතිවී තිබෙන ප්‍රශ්නයට පළමුව විසඳුම් සෙවීමට ද, වෙනත් මේ හා බැඳුන ප්‍රශ්න ක්‍රමයෙන් විසඳීමට ද තීරණය කළේය. ආයතනය විසින් වැව් නවීකරණය කිරීමේ වැඩසටහන එවැනි අවබෝධයකින් යුක්තව ආරම්භ කළේය. වැව් නවීකරණය කිරීමේ සෘජු වැඩසටහන් සඳහා දායකවී නැති නිසා ආයතනයේ ක්‍රියාකාරිත්වයට පාත්‍ර වූ විශේෂ ව්‍යාපෘතියක් ලෙස මෙය සැළකිය හැකිය. සහභාගීත්ව ප්‍රවේශය හරහා ගම්මුන්ට උපරිම ප්‍රතිලාභ ලබාදෙමින් මෙයට මුදල් සපයන ලද ජනසවිය භාරකාර අරමුදලේ ද ප්‍රසාදය දිනා ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආයතනයේ අවශ්‍යතාවය විය.

## 3.6 ව්‍යාපෘති කටයුතු

ව්‍යාපෘතියේ දිගුකාලීන අරමුණු පහත සඳහන් ය.

i. කෘෂිකර්මය සහ ගෙදරදොර අවශ්‍යතා සඳහා ජලය සැපයීම දියුණු කිරීම.
ii. ගස් ගොම්මන වැඩිදියුණු කිරීම.
iii. ක්ෂේත්‍ර බෝග සහ ආහාර බෝග වගාව සංවර්ධනය කිරීම.
iv. සත්ත්ව පාලනය වැඩිදියුණු කිරීම.
v. මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතරතුරදී ඵලදායක ලෙස සමාජ සජීවීකරණයක් කිරීම.

ඉහත සඳහන් කරන ලද අරමුණු වසර දෙකක් තුල දී ක්‍රියාත්මක කර අවසන් කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය.

## 4.0 සංවර්ධන ක්‍රියාවලියේදී ජනතා සහභාගිත්වයට බලපාන සාධක හඳුනා ගැනීම

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වල දී, ජනතා සහභාගිත්වයට බලපාන සාධක පවත්නා සාහිත්‍ය මාර්ගයෙන් හෙළි දැක්වීම මෙම කොටසේ දී සිදු කෙරෙයි. ක්‍රියාත්මක ව්‍යාපෘතියෙහි පරිසරය, ප්‍රදේශයේ පවත්නා භෞතික සහ ජීව විද්‍යාත්මක සම්බන්ධතාවයට අනුව ආර්ථික, සාමාජික, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් ඒවා කණ්ඩායම්ගත කළ හැකිය. විශාල පලාත් සහ ජාතික රාමුවකට හා ජාතික භෞතික, ආර්ථික, දේශපාලනික සමාජ සහ සංස්කෘතික චරිතාංගයන්ට මෙම ග්‍රාමීය හෝ කුඩා නාගරික පරිසරයේ සාධකයන් සම්බන්ධ කර ඇත. මෙම සම්බන්ධතාව ඉදිරියේ දී රූපසටහන් අංක 1 සහ 2 මගින් දක්වා ඇත.

## 4.1 භෞතික හා සමාජ විද්‍යාත්මක සාධක

කාලගුණික වෙනස්වීම් සහ දේශගුණික තත්ත්වයන් හරහා රටේ භෞතික තත්ත්වය ජනතා සහභාගිත්වයට බලපායි. දීර්ඝ වැසි සමයන්හි දී මාර්ග හා අඩි පාරවල් පාවිච්චි කිරීමට නොහැකි නිසා ක්‍රමවත්ව සහයෝගිතා රැස්වීම් පැවැත්වීමට නොහැකිය. ජනතාව ජීවත්වන බෑවුම් කඳු ප්‍රදේශ සහ වන්නාන්තර ප්‍රදේශවල මහා මාර්ග හානි වීමට ඉඩ ඇති නිසා රැස්වීම් සහ සාකච්ඡා සඳහා සහභාගි වීමට ජනතාව මැලිකමක් දක්වති.

ගොවි සංවිධාන රැස්වීම් සඳහා ගොවීන්ගේ සහභාගිත්වය ලබා ගැනීමේ දී කඳුකර නේපාලයට වඩා වෙනස් තැනිතලා බංගලාදේශයේ දී විශාල පහසුවක් දක්නට ලැබේ. මෙයට බොහෝ සමාන දේශගුණයක් පවතින ශ්‍රී ලංකවේ සහභාගිත්වය සඳහා ඉතා වාසනාවන්ත තත්ත්වයක් පවතී. (Cohen and Uphoff, 1997)

දුර්වල පාංශු තත්ත්වයක් සහිත කඳුකර ගොවීන් තැනිතලා ඉඩම්වල වගා කටයුතු කරන ගොවීන්ට වඩා අපහසුවෙන් වගා කටයතු කරන නිසා ඔවුන්ට ගොවි සංවිධාන රැස්වීම් හෝ වෙනත් ජන සහභාගිත්ව පිළිබඳ කටයුතු සඳහා සහභාගී වීමට කාලයක් ඇත්තේ නැත. යහපත් ජල සම්පාදන යෝජනා ක්‍රමයක් පවතින සාරවත් ප්‍රදේශවල ජනතාව ජීවත් වන්නේ පහසුවෙනි. කටුක දේශගුණයක් සහිත ප්‍රදේශ වලදී සහ රටේ උෂ්ණ ප්‍රදේශ වලදී ජනතාව ජීවත් වන්නේ ඉතා අපහසුවෙනි. කෘෂි දේශගුණික කලාප, උෂ්ණත්වයේ ඉතා කුඩා වෙනස්කම්, වර්ෂාපතනය, උන්නතාංශය කෘෂි බෝග වගාවේ පහසුකම් ආදිය විවිධ වර්ගයේ ජනතා සහභාගිත්වය සඳහා බලපාන්නේය. රබර් වගාව ජීවනෝපාය කරගත් ජනතාව දවසේ උදය කාලයේ රබර් කැපීම සම්බන්ධ කටයුතුවල නිරත බැවින් සහභාගි වීමට නොහැකිය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ඇතැම් ප්‍රදේශවල ගොවි පවුල්වලට හේන් වගාව සඳහා දුරබැහැර ප්‍රදේශ වලට සංක්‍රමණය වීමට සිදු වේ. එමනිසා, ඔවුන්ගේ සහභාගිත්වය ලබාගැනීම අපහසු වේ. ග්‍රාමීය පෙදෙස් වල වගාවන් සඳහා බිම් සකස් කරන සමයේ සහ අස්වනු නෙලන සමයේ රැස්වීම්, සාකච්ඡා හෝ වෙනත් සහභාගිත්ව කටයතු සඳහා යෙදීම දුෂ්කර වී තිබේ.

## 4.2 ආර්ථිකමය සාධක

ජනතා සහභාගිත්වය සඳහා ආර්ථිකමය සාධකවල බලපෑම ඉමහත් ය. ඕනෑම සමාජයක ජනතාව දුප්පත් නම් සිය පවුල් නඩත්තු කිරීම සඳහා දෛනික මුදල් ඉපැයීමේ දී අරගලයක යෙදීමට සිදු වේ. එමනිසා, එවැනි කොටස් වලට කිසිම සහභාගිත්ව ක්‍රියාවලියකට සහභාගිවීමට අවස්ථාවක් නොලැබේ. යහපත් සන්නිවේදන ජාලයක් නොමැතිවීම හේතුවෙන් එවැනි ප්‍රජාවන් සමාජයේ හුදකලා බවට පත් වේ. තුන්වන ලෝකයේ බොහෝ සමාජයන්හි එකම පුද්ගලයා විසින් කෘෂි යෙදවුම් සැපයීම, ණය සැපයීම හා අස්වැන්න මිල දී ගැනීම ද සිදු කරයි. මෙවැනි තත්ත්වයක් යටතේ එවැනි සමාජයන්හි

ගොවීන්ට අලෙවියේදී අසාධාරණ තත්ත්වයන්ට මුහුණදීමට සිදු වේ. යම්කිසි රටක ගොවි ජනතාව සඳහා වගා කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩම් නොමැති වූ විට, ඔවුන්ට ඉඩම් හිමියන්ගේ ඉඩම් මත යැපීමට සිදු වෙයි. සමහර විට ජනගහනයෙන් අඩක්ම දිළිඳුකම නිසා අඳයට වගා කරන තත්ත්වයක් යටතේ යම්කිසි ප්‍රජා සංවර්ධන කටයුත්තක් සඳහා ඉඩම් ලබාදීමට හැකියාවක් නැත. උදාහරණ වශයෙන් ගමෙහි පාසැලක් සඳහා හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සඳහා හෝ විය හැකිය. මහා මාර්ග පහසුකම්, ප්‍රවාහන පහසුකම්, විදුලිබල පහසුකම් වැනි පහසුකම් ඇති නැති බව ද ජනතා සහභාගිත්වයේ තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ භුක්ති විඳීම යන සහභාගිත්ව ප්‍රභේද සඳහා බලපෑම් ඇති කරයි.

## 4.3 දේශපාලන සාධක

රට තුළ දේශපාලන වාතාවරණය සහ එහි ස්වභාවය ජනතා සහභාගිත්වය කෙරෙහි බලපෑමක් ඇති කරයි. විශේෂයෙන් තීරණ ගැනීමේ සහභාගිත්වයේ දී දේශපාලන සාධක බලපායි. සහභාගිවන්නේ කවුද? තීරණ ගන්නේ කෙසේද? ආදී වශයෙනි. තුන්වන ලොවේ රටවල පවත්නා මතවාදීමය තත්ත්වය ජනතාව විවෘත අදහස් දැක්වීමට උනන්දු නොකරයි. රජය සෑම දෙයක්ම ඉතා තදින්ම පාලනය කරයි. මෙම තත්ත්වය ජනතා සහභාගිත්වය පරිපාලනය කිරීම හෝ සංවර්ධනය කිරීමට උපකාරී නොවේ. පවත්නා මධ්‍යගත දේශපාලන ක්‍රමය තීරණ ගැනීම සහ පරිපාලනය සඳහා පවත්නා යාන්ත්‍රණයට දක්වන්නේ ඉතා සුළු අවධාරණයක් පමණි. මෙම තත්ත්වය ඉතා යහපත් ජනතා සහභාගිත්වයක් ලබා ගැනීම සඳහා විශාල බාධකයක් වෙයි. මධ්‍යගත සැළසුම් ක්‍රමයක් සහිත රාජ්‍යයන් ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතීන්හිදී තීරණ ගැනීම් යාන්ත්‍රණය සඳහා ග්‍රාමීය මට්ටමේ ජනතාව සහභාගි කර නොගනී. මෙම තත්ත්වය Oakley (1991, පිටුව 27) විසින් විස්තර කරන්නේ මේ අයුරිනි.

'රජය මධ්‍යගත සැළසුම් අරමුණු ළඟාකර ගැනීමේදී සංවර්ධන ව්‍යාපෘති සහ වෙනත් විවිධ ග්‍රාමීය සංවර්ධන උත්සාහයන් වල දී ඒවායේ සහභාගිවන්නන් නියම සහභාගිත්ව ක්‍රියාවලියට වැද්දා ගැනීමක් සිදු නොවේ'.

මධ්‍යගත පාලන ක්‍රමයකට වඩා විමධ්‍යගත පාලන ක්‍රමයක දී එම ප්‍රදේශයේ ජනතාව නියෝජනය වීමක් සිදු වේ. එසේම ඔවුන් හට වැඩ කිරීමට පහසුකම් සලසාදෙනු ලබයි. මධ්‍යම රජය කරනු ලබන්නේ ග්‍රාමීය සංවර්ධන සඳහා විශේෂිත සහයෝගයක් ලබාදීම පමණි. බටහිර දේශපාලන න්‍යායට අනුව, ඡන්දය යනු සහභාගීත්වයේ අවශ්‍ය අංශයකි. තුන්වන ලෝකයේ රටවල ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් වල දී සහභාගිත්වය මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස ඡන්දය භාවිතා කරයි. තුන්වන ලෝකයේ රටවල පළාත් පාලන මැතිවරණ වල දී ඇතැම් විට තෝරා පත්වනු ලබන්නේ එම ප්‍රදේශයන් හි ප්‍රභූවරුන්ය. එහෙත් ඔවුන් ග්‍රාමීය දුප්පතුන් සැබැවින්ම නියෝජනය නොකරයි.

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වල දී පක්ෂ දේශපාලනයේ සෘජු බලපෑම් දක්නට හැකිය. දේශීය ජනයාගේ සහභාගිත්වය මත ඉතා ප්‍රබල බලපෑමක් කිරීමට හා ඔවුන්ගේ ජනප්‍රියතාවය වැඩි කිරීමට පාලනය කරනු ලබන දේශපාලන පක්ෂ නිතර උත්සාහ දරයි.

සහභාගිත්වය වැඩිදියුණු කිරීමේ උත්සාහයන්හි දී රටක පවත්නා නීති-රීති පද්ධතියට ඉතා දැඩි ලෙස බලපෑමක් සිදුවීමට පුළුවන. රටේ පවතින නීති පද්ධතිය හැමවිට ක්‍රියා කරන්නේ පවතින තත්ත්වය පවත්වාගෙන යාමටය. නීතිමය අයිතීන් සහ නීතිමය වශයෙන් ජනතාවට තිබෙන්නේ මොනවාද? යන්න බොහෝ ග්‍රාමීය ජනයාට දැනුමක් නොපවතී. ඇතැම් නීති ක්‍රමයන් ග්‍රාමීය ජනයාට ප්‍රතිලාභ ලබාගැනීටම සලස්වයි. තවත් විටක, නීති පද්ධතිය ග්‍රාමීය ජනතාවගේ සංවිධානයන්ට හෝ යම්කිසි අරමුණක් සඳහා ඒකරාශී වීමට සෘජු බාධකයක් ලෙස ක්‍රියා කරයි.

## 4.4 සමාජයීය සාධක

සමාජයේදී ප්‍රජාව එකට තබා ගැනීම සඳහා සමාජයීය සාධක ඉතාම වැදගත්ය. හොඳ ජනතා සහභාගිත්වයක් සඳහා ජනතා කණ්ඩායම් වැදගත් කර්තව්‍යයක් ඉටු කරනු ලබයි. සමාජ සාධකයන් තනි තනියෙන් පවත්නා පුද්ගලයන් සඳහා සහ කණ්ඩායම් වශයෙන් පවතින පුද්ගලයන් සමග සම්බන්ධ කිරීමට මග පෙන්වන්නේ සමාජ සාධකයන්ය. සංවිධානයන්ගේ සමාජ ක්‍රමයන් සහ එහි ක්‍රියාකාරිත්වය රට තුල දී දේශපාලනික සම්බන්ධතාවයට වඩා පුළුල් ලෙස වෙනස් වේ. බොහෝ ප්‍රජාවන් තුළ අන්තර් සමාජ වෙනස්කම්, පුද්ගලයන් සම්බන්ධයෙන් සහ අන්තර් කණ්ඩායම් සම්බන්ධයෙන් පවතී. සමාජ කණ්ඩායම් තුළ කැපී පෙනෙන සහභාගිත්වයක් ලබා ගැනීමේදී එම කණ්ඩායම්වල ස්වභාවය නිසා මෙම තත්ත්වයට අසාර්ථක උත්සාහයකි. තීරණ ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ සහභාගිත්වයේ විවිධ මට්ටම් විභාග කිරීමේ දී, විශේෂයෙන්ම යමෙකු එවැනි සාධක සමග එකඟ විය යුත්තේය.

ඇතැම් විශේෂිත ප්‍රදේශයන්හි ග්‍රාමීය සංවර්ධනයේ දී ජනතාවගේ කුලය හා ජාතිය ද සහභාගිත්වය කෙරෙහි බලපෑමක් ඇති කරයි. විශේෂයෙන්ම, ඉන්දියාව වැනි රටවල කුල ක්‍රමය ඉතා විශාල ලෙස බලපාන අතර යම්කිසි සංවර්ධන කටයුත්තක් සඳහා ජනතාව ඒකරාශී කිරීමේ දී එය අතිශය අපහසුය.

අද ගොවි ක්‍රමයේ දී සහ ජාතිකත්වයේදී සහයෝගිතාවය ලබා ගැනීම අතිශය අපහසුය. ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා වන ප්‍රාදේශීය මට්ටමේ ආයතනයන් සමාජයේ ජනතාවගේ හොඳ තත්ත්වයක් ඇති කරලීම සඳහා සහාය ලබාදෙයි. මෙම පිරිස නිතිපතාම හමුවී ප්‍රශ්න සාකච්ඡා කිරීම සහ ඒ සඳහා වූ ක්‍රියාමාර්ග ඔවුන් විසින්ම තීරණය කරයි. සමාජයේ ජනතාවගේ විවිධ හේතූන් මත ඇතැමුන් වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වන්නේය. එවැනි අවස්ථා වල දී ඉතා සුළු පිරිසකගෙන් සමන්විත සංවිධානයක් ගොඩනැගීම ඉතා අපහසු කරුණකි. ඉහත සඳහන් කරන ලද සමාජ සාධක ජනතා සහභාගිත්වය සඳහා විශාල පරිමාණයෙන් බලපාන්නේය.

## 4.5 සංස්කෘතික සාධක

ඉහත සඳහන් කරන ලද වෙනත් හැම සාධකයක් මෙන්ම සංස්කෘතික සාධක ද ජනතා සහභාගිත්වය සඳහා අතිශයින්ම සම්බන්ධ වේ. අන්තර් කණ්ඩායම් සහ අන්තර් පුද්ගල හැසිරීම සහ සමාජ සාධක අතර සියළුම සාධක අන්‍යෝන්‍ය වශයෙන් බලපැවැත්වීම සහ ඇතැම් ඒවා වෙනසක් කිරීමට පුළුවන. ජනතාව ජීවත්වන ප්‍රදේශයේ වටිනාකම් ජනතා සහභාගිත්වය කෙරෙහි බලපායි. ඇතැම් සමාජයන්හි ජනතාවගේ ස්ත්‍රී-පුරුෂ ක්‍රියාකලාපයන් මිශ්‍ර කල නොහැකිය. මෙම සමාජයන්හි ස්ත්‍රී-පුරුෂ භාවය නොතකා ජනතා සහභාගිත්වය ලබාගැනීම අපහසුය.

ඇතැම් සමාජයන්හි ප්‍රජා වැඩකටයුතු වල දී ස්ත්‍රීන්ගේ සහභාගිත්වය සඳහා ප්‍රබල විරුද්ධත්වයක් තිබේ. ඇතැම් සමාජයන්හි ස්ත්‍රීන් ගෙදරින් හෝ නිවෙසින් පිටට යාමට ඉඩක් නැත. බොහෝ සංස්කෘතීන්හි දර්ශනය අනුව යම් යම් කටයුතු සඳහා සුදුසු පුද්ගලයා ස්ත්‍රිය වෙයි. නැතහොත් පුරුෂ පක්ෂය වෙයි. එසේ නොමැතිව දෙපිරිසම නොවේ. මේ සඳහා තුන්වන ලෝකයේ පාකිස්ථානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවලින් බොහෝ උදාහරණ පෙන්වීමට පුළුවන. මෙම තත්ත්වය පිළිබඳව Cohen and Uphoff:(1977) මෙසේ ප්‍රකාශ කර ඇත.

'යම්කිසි ප්‍රදේශයක සංස්කෘතික ව්‍යවහාරයන් මිනිසුන්ට අණ කරයි. උදාහරණයක් වශයෙන් ස්ත්‍රීන්ට ස්වාධීනව තීරණ ගැනීමේ කර්තව්‍යය කළ නොහැකිය. එසේම නිවසින් පිට වැඩ කිරීමට නොහැකිය. මෙවැනි සමාජවල කාන්තා සහභාගිත්වය සීමිත යැයි හෝ ඇත්තෙන්ම නැතැයි හෝ යමෙකුට ස්ථිරවම ප්‍රකාශ කිරීමට පුළුවන'.

## 4.6 පරිපාලන සාධක

සංවර්ධනය වෙමින් පවතින රටවල ඇත්තේ මධ්‍යගත පරිපාලනයක් සහිත ආණ්ඩුවකි. තීරණ ගැනීම, සම්පත් බෙදා හැරීම, තොරතුරු සැපයීම සඳහා මෙම ක්‍රමය වගකීමක් දරයි. ජනතා සහභාගිත්වයක් නොමැතිව පරිපාලන නිලධාරීන් විසින් මෙම කටයුතු ක්‍රියාත්මක කරයි. පරිපාලන නිලධාරීන් විසින් ගර්වයක් ප්‍රදර්ශනය කරයි. එසේම, ගම්බද ජනතාවට පරිපාලන කටයුතු පිළිබඳ ඕනෑම වගකීමක් දැරීමට හැකිය යන්න අවිශ්වාස කරයි. (Oakeey :1991,පිටුව 31)

එසේම අමාත්‍යාංශයන්හි සැළසුම් කිරීම සිදුවන්නේ නාගරික ප්‍රදේශවලය. ග්‍රාමීය මට්ටමෙන් ඉතා සඵලදායක ලෙස මෙම වගකීම සංවර්ධනය කිරීමට අවංක උත්සාහයන් ඉතා කලාතුරකින් ගනී. සැළසුම් තොරතුරු සහ දත්ත සැමවිටම ස්වාභාවයෙන්ම සංකීර්ණය. බොහෝ ග්‍රාමීය ජනතාව ඒවා ඉතාම බුද්ධිමත් ආකාරයකින් විස්තර කරදෙන්නේ හෝ ඉදිරිපත් කරන්නේ කලාතුරකිනි. තුන්වන ලෝකයේ බොහෝ සංවර්ධනය වන රටවල පරිපාලන ව්‍යුහය නොවෙනස්වන ස්වභාවයෙන් මධ්‍යගත වී ඇත්තේ අවශ්‍යයෙන්ම සහභාගිත්වයට විරුද්ධ අර්ථයෙනි.

## 4.7 ඓතිහාසිකමය සාධක

ප්‍රදේශය පාලනය කරන ලද පුද්ගලයන්ගේ අතීත සම්බන්ධකම්, ප්‍රදේශයේ ජනාවාස ඇතිවීම සහ ප්‍රදේශයේ ඉතිහාසය විසින් සහභාත්වයට බලපෑම් ඇති කරනු ලබයි. රටේ අගනුවර හා සමග ව්‍යාපෘති ප්‍රදේශයේ අතීත සම්බන්ධතාවය හා එහි සැළකිල්ල ජනතා සහභාගිත්වය කෙරෙහි බලපායි. තුන්වන ලෝකයේ බොහෝ රටවල ග්‍රාමීය සංවර්ධන කටයුතු පිළිබඳ ග්‍රාමීය ජනයාගේ අතීත අත්දැකීම්, සැළසුම් කිරීම, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම යන සංවර්ධන ක්‍රියාදාමයේ යම්කිසි අවධියකදී භාවිතයට නොගන්නවා මෙන්ම ග්‍රාමීය ජනයා සහභාගී නොවන, මධ්‍යම රජය විසින් ඉහළ සිට පහළට සැළසුම් කරන ලද ප්‍රවේශයන් වෙයි. එම නිසා, ග්‍රාමීය ජනතාව නව සංවර්ධන කටයුතු පිළිබඳව සහභාගීවීමට පසුබෑමක් දක්වයි. තාක්ෂණික වශයෙන් ඇති පහසුවෙහි මට්ටම ද ජනතා සහභාගීත්වයට බලපායි. යම් ව්‍යාපෘතියක බීජ වී පැළවීම නියමාකාරයෙන් සිදු නොවීම පිළිබඳ අතීත අත්දැකීමක් පවතී නම්, ජනතා සහභාගිත්වය මාර්ගයෙන් නව වැඩිදියුණු කරන ලද බීජ වර්ග සඳහා පෙළඹවීම අතිශය දුෂ්කරය. (Cohen and Uphoff: 1977, පිටුව 32).

හොඳ හෝ නරක හෝ දෙකම නොමැති, විදේශීය ආයතන මුල ආධාර මත හෝ රජය විසින් කරනු ලබන වැඩසටහන් පිළිබඳව අවබෝධයක් ඇති ජනතාව නව අවබෝධයකින් යුතු වැඩසටහන් සඳහා සහභාගීවීමට කැමැත්ත පල කරයි.

ප්‍රදේශ, ප්‍රදේශ අතර ප්‍රජාවන් ප්‍රජාවන් අතර පවුල්, පවුල් අතර පවතින තරගය සම්බන්ධයෙන් වූ යම් කිසි සිරිතක් පිටස්තර ආයතනයන් නිතරම පරීක්ෂා කිරීම එක්තරා ඓතිහාසික සාධකයකි. මෙය තරමක් පොදු වූවකි. නව දුරටත් සංවර්ධන විද්‍යාඥයින් සිය සංවර්ධන වැඩ වලින් විශාල ප්‍රතිලාභ ඒ සඳහා සහභාගී වූ සියල්ලන්ටම ලැබෙන බව ඒත්තු ගන්වයි. එසේම, ඔවුන් එවැනි ඉතිහාසයක් හෝ තරගයක් පිළිබඳව පරීක්ෂා කිරීමට කැමැත්ත ඇති කරවයි.

## 4.8 පුද්ගල අත්දැකීම් මත සංවර්ධන ක්‍රියාවලියේදී ජනතා සහභාගීත්වය සඳහා බලපාන සාධක

මෙහිදී මා එළිදැක්වීමට උත්සාහ කරන්නේ කැලේගම කුඩා වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතියේදී මා ලද අත්දැකීම් අනුව එම ව්‍යාපෘතිය සඳහා ජනතා සහභාගිත්වයට බලපෑ සාධකයන් සමහරකි.

### 4.8.1 සමාජයීය සාධක

මගේ අත්දැකීම් අනුව, කැලේගම ව්‍යාපෘතිය සඳහා ජනතා සහභාගිත්වය අඩු හෝ වැඩිවීමට බලපෑ වැදගත් හේතුවක් වූයේ සමාජයීය සාධකයන්ය. කැලේගම වැනි වියළි කලාපීය වැව් ජනාවාසයක ජනතාව දීර්ඝ කාලයක් ජීවත්වීමෙන් කටුක දේශගුණික තත්ත්වයකට හැඩගැසී ඇත. ග්‍රාමීය ජනතාව විශ්වාස කරන්නේ වර්තමාන ජීවිතයේ සෑම දෙයක්ම සිදුවන්නේ පසුගිය ආත්මයේදී රැස් කරගත් කර්මය මත බවයි. එහෙයින් මොවුන් වියළි කලාපයේ වැව් ගම් ප්‍රදේශයක දුප්පතුන්ව උපත ලැබුයේ පෙර භවයේ කරන ලද කර්ම මතයි. එසේම, ඔවුන් විශ්වාස කරන්නේ දුප්පත්කම ඔවුන්ට උරුම වූ දෙයක් බවත්, එහෙයින් එය මේ භවයේදී ඉවසමින් අත්විඳිය යුතු බවයි. කැලේගම ව්‍යාපෘතියට සම්බන්ධව සිටි වැඩිදෙනා වැඩිමහල්ලන් ය. තරුණ පිරිස ඉතා ටික දෙනෙකි. ඔවුන්ගේ අධ්‍යාපනයද පහත් මට්ටමක විය. එමනිසා, ඔවුන්ගේ සිතීමේ ඉඩකඩ ඉතා සීමිත විය. මෙම තත්ත්වය මත ඔවුන්ගේ වැඩ කිරීමේ උනන්දුව සහ ස්වයං විශ්වාසය පහත් තත්ත්වයක පැවතිණි. ඔවුන්ට ඉතා හොඳින් සංවිධානය වූ ප්‍රජා සංවිධාන සහ ජනතාව ඉදිරියට ගෙන ඒමට ක්‍රියාකරන ප්‍රජා නායකත්වයක් ද ගමෙහි නොමැති වූ අතර ඒ සඳහා සම්පත් ද නොවීය. මෙම සියළුම හේතු සාධක මත ගමේ ජනතාව මෙම ව්‍යාපෘතිය පිළිබඳව මහත් බලාපොරොත්තු ඇතිකර ගත්හ. ඇතැම් අය ව්‍යාපෘති අවසන් වීමෙන් පසුව ග්‍රාමීය කර්මාන්ත ඇතිකර ගැනීම සහ සත්ත්ව පාලනය සඳහා ව්‍යාපෘතිය ඒ මඟින් සහායක් ලබාදේවි යැයි බලාපොරොත්තු විය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක අවධියට පැමිණි පසු ගම් වැසියන්ගේ පොදු මතය යොමු වූයේ ව්‍යාපෘතිය රැකියා අවස්ථාවක් සහ ආදායම් මාර්ගයක් ජනිත කරවන්නක් ලෙසිනි. ජනතා සහභාගිත්වය යන්න ක්‍රියාත්මක වූයේ මෙම ප්‍රධාන කරුණ මත සිටය. මෙය පොළඹවන ලද සහභාගිත්වයයි. එසේ වීමට හේතුව අතිශය දිළිඳු ජනතාව බලාපොරොත්තු වන්නේ කෙටි කාලීන ප්‍රතිලාභය. එම නිසා, ඔවුන් ප්‍රමුඛත්වය ලබාදුන්නේ මුදල් ඉපැයීමටය. එසේ වුවත්, ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයා නැවත නැවතත් ජනතා සහභාගිත්වය පිළිබඳව දැනුවත් කිරීම් කරන ලද්දේය. මෙහිදී ජනතා සහභාගිත්ව සංකල්පයේ විග්‍රහකර ඇති ආකාරයට සැළසුම්කරනු ලබන අවස්ථාවේදී හා ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේදී එම කාර්යයන් සඳහා අවශ්‍ය ජනතා සහභාගීත්වය නොඅඩුව ලැබුන බව පැවසිය හැකිය. එසේ වුවද, විවිධ තරාතිරම් වලට අයත් විවිධ මානසික මට්ටම් සහ කුල භේද සළකන ප්‍රජාවක් කය වෙහෙසමින් ශ්‍රමය සපයන මෙවැනි වැඩ බිමක මිනිසුන්ගෙන් දක්නට ලැබෙන පොදු දුර්වලතාවයන් මෙහිදී ද දක්නට ලැබුණි. ආරම්භයේදී සඳහන් කරන ලද ආකාරයෙන් කැලේගම ග්‍රාමසේවා වසමේ කැලේගම කොටසේ ජනතාව කුලවත් අය වශයෙන් ද පාළුගම නමැති කොටසේ ජනතාව කුලහීන අය වශයෙන් ද සම්මතයක් පැවතිණි. වැව් පුරුත්ථාපන වැඩසටහන කලින් කල අධීක්ෂණය කිරීම සඳහා සියළුම වැව් වල වැඩකරන ජනතාවගේ සහභාගිත්වයෙන් රැස්වීම් පවත්වයි. මෙවැනි රැස්වීම් වල දී වැව් පුනරුත්ථාපන වැඩසටහන කෙරීගෙන යන ආකාරය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේ සමාන අවස්ථාවක් සෑම කෙනෙකුටම ලැබේ.

එසේ වුවත්, මෙවැනි අවස්ථාවලදී වැඩි වශයෙන්ම අදහස් ප්‍රකාශ කරන්නේ කුලවත් පුද්ගලයන් විසිනි. කුලහීන පාළුගම ගමේ ජනතාවගෙන් සිය අදහස් ප්‍රකාශ කරන්නේ ඉතාම සුළු පිරිසකි. Paulo Freire (1972) දී ප්‍රකාශයට පත් කළ Padagogi of the oppressed නැමති කෘතියේ සඳහන්

කල ආකාරයට ජනතාවගේ නිහඬබව culture of silance ජනතා සහභාගිත්ව සංකල්පයට පටහැනි දෙයකි. එමඟින් ක්‍රියාකාරී ව්‍යාපෘතියකට සාධාරණ විවේචනයක් එල්ලවීමට ඇති අවස්ථාව වළකයි.

### 4.8.2 ඉඩම් හිමිකම

පුනරුත්ථාපනය කරන ලද සෑම වැවක් යටතේම ඉඩම් හිමිකම ඇති ගොවීන් සංඛ්‍යාව ඉතා සුළු පිරිසකි. එසේම මෙම කුඹුරු ඉඩම් අක්කර 21 න්, එහි අයිති ගොවි පවුල් 48 සඳහා වර්ෂයක් ජීවත්වීමට තරම් ප්‍රමාණවත් ආදායමක් නොලැබේ. එමනිසා, ඒ වගාව මෙහි ඇතැම් ගොවි පවුලකට වැදගත් ආර්ථික සාධකයක් වූයේ නැත. අනෙක් අතින් මෙම වැව් සඳහා ස්ථිර ජල මූලයකින් ජලය නොලැබෙන බැවින් වැව් පුනරුත්ථාපනය කිරීම ජල හිඟයට ස්ථිර විසඳුමක් නොවේ. වැවෙහි පෝෂිත පෙදෙස ලැබෙන වැස්ස පමණක් වැවට ජලය ලබාදුන් එකම මූලාශ්‍රය විය. මෙවැනි කරුණු නිසා ඇතැම් ගොවීහු වැව් පුනරුත්ථාපනය කිරීම යනු ජලය හිඟයට තාවකාලික විසඳුමක් පමණක් යැයි සිතූහ. ඇතැම් ගොවියකුගේ ජනතා සහභාගිත්වය තීරණය කිරීමට මෙම කරුණු ද හේතු වූ බව කිව හැකිය.

### 4.8.3 ඓතිහාසික සාධක

නවීන අර්ථයෙන් ගත් කළ සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ සංදර්භය ග්‍රාමීය ජන සමාජයෙන් ඉවත්ව ඇත. ඉතා පුරාණ කාලයේ රටේ කෘෂිකාර්මික හා සමාජ සංවර්ධනය සඳහා ජනතාවගේ සහභාගිත්වය නොඅඩුව ලබා ගත්තේය. එහෙත්, ක්‍රමිකව එම කටයුතු සියල්ල රජය විසින් කිරීමට භාර ගනු ලැබීය. මේ නිසා දශක ගණනාවක් තිස්සේ සියළුම ග්‍රාමීය සංවර්ධන කටයුතු, වාරිමාර්ග ද ඇතුළුව කරුනු ලැබුවේ රජය මඟින් පමණි. සෑම සංවර්ධන කටයුත්තක්ම මධ්‍යම රජය විසින් ඉහළ සිට පහළට සංවර්ධන ක්‍රමවේදය මත කරන ලද අතර සැළසුම් සහ ක්‍රියාත්මක කිරීමේදී ජනතා සහභාගිත්වයක් පිළිබඳව තැකීමක් කළේ නැත. එමනිසා, ජනතාව මෙම කටයුතු වලට පිටස්තර පිරිසක් ලෙස සිටි අතර ඔවුන්ගේ සංවර්ධන කටයුතු රජය විසින්ම කළ යුතුය යන හැඟීම සමාජය තුළ වැඩුනු අදහසක් විය. මේ නිසා පැවති සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශය වූ ඉහළ සිට පහළට සංවර්ධන ප්‍රවේශය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද්දේ කොන්ත්‍රාත්කරුවන් විසිනි. ග්‍රාමීය ජනතාව ඒවායේ කම්කරුවන් පමණක් විය. මෙවැනි අත්දැකීම් සහිත කැලේගම ජනතාව ද සිතුයේ මෙම ව්‍යාපෘතිය ද තවත් එවැනිම ව්‍යාපෘතියක් ලෙසිනි. ජනතා සහභාගීත්වය පිළිබඳ දැනුවත් කිරීම් ඔවුනට අමතක වන්නට ඇත. එසේම ලෝක ආහාර වැඩසටහන යටතේ නියං සහනාධාර වැඩ පිළිබඳව වියළි කලාපයේ ජනතාව වසර කීපයක් අත්දැකීම් ලබා ඇත්තේය. වියළි කාලයේ දී මෙම ප්‍රදේශවල ජනතාව වැව් පිළිසකර කිරීම, මාර්ග පුනරුත්ථාපනය කිරීම වැනි සංවර්ධන කටයුතුවල යොදවා ඒ සඳහා ඔවුන්ට ආහාර මල්ලක් ලබා දෙන ලදී. මෙය ක්‍රියාත්මක කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාර්ගයෙන් ග්‍රාම නිලධාරී මහතාගේ මූලිකත්වයෙනි. මෙම වැඩ බිම් වලට පැමිණෙන ජනයා වැඩ කරන්නේ ඉතා සෙමිනි. අවසානයේ 'සහල් ඇතුළු ආහාර මල්ලක් සඳහා ඔවුන්ට හිමිකම ලැබේ. එම අත්දැකීම් කැලේගම කුඩා වැව් පුනරුත්ථාපන වැඩසටහන සඳහා ද බලපෑමක් ඇති කරන්නට ඇත. එමනිසා, මෙහිදී ද ජනතාව කාර්යක්ෂමව වැඩ කිරීමට වඩා සෙමින් වැඩ කිරීමක් දක්නට ලැබුණි. ව්‍යාපෘතිය ආරම්භ කරන ලද කාල සීමාව ප්‍රදේශයේ වියළි කාලගුණික සමය වූ අතර එය ජනතාවට ඉතාම අසීරු විශේෂයෙන්ම ආර්ථික අතින් ඉතාමත්ම අසීරු කාලයකි. එම නිසා වැව් පුනරුත්ථාපන වැඩ බිමේ වැඩ කිරීම ඔවුන්ට ලැබුන මහඟු ආදායම් ඉපැයීම් අවස්ථාවක් විය.

### 4.8.4 දේශපාලනික සාධක

එවකට පැවති රජයේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධානම ස්ථානයක් ගෙන තිබුනේ දිළිඳුකම දුරලීමේ ජාතික වැඩසටහනක් වශයෙන් ජනසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. දුප්පත්ම ජනතාව, මෙම

වැඩසටහන යටතේ පවුලේ සාමාජික ප්‍රමාණය අනුව මුදල් සහ ආහාර මල්ලක සහනාධාරයක් ලැබීමට හිමිකම් ලැබ සිටියහ. ජනසවිය වැඩසටහනට අයත් වූ ජනයා සතියකට දින කිහිපයක්ම ප්‍රජා සංවර්ධන වැඩ කටයුතුවල යෙදිය යුතුව තිබුණි. කැලේගම කුඩා වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා මුදල් සපයන ලද්දේ ජනසවිය භාරකාර අරමුදල මගිනි. එමනිසා, ජනසවිය භාරකාර අරමුදල යටතේ ක්‍රියාත්මක වන කැලේගම වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතිය යනු ජනසවිය ව්‍යාපෘතිය ලෙස ජනතාව කල්පනා කළහ.


මෙනිසා කැලේගම ගමේ ඇතැමුන් කල්පනා කරන ලද්දේ ජනසවිය ලැබීමට හිමිකම ඇති ජනතාවට වැව් ව්‍යාපෘතියේ වැඩ කිරීම ඔවුන්ගේ අයිතියක් බවයි. එමනිසා, මෙහිදී ඔවුහු ඉතාමත් වෙහෙස මහන්සි වී වැඩ කිරීම අනවශ්‍ය බව කල්පනා කළහ. ටිකක් වැඩ කර දෛනික දීමනාව ලබා ගැනීමට එවැනි ජනයාගේ අපේක්ෂාව විය. දිගු කලක් පුරා දේශපාලනඥයන් විසින් ග්‍රාමීය ජනතාව තුළ වර්ධනය කරන ලද මානසික තත්ත්වයක් වූයේ දේශපාලන පොරොන්දු ක්‍රියාත්මක කර දුප්පත් ජනතාවට සහනයක් ලබා දී ඔවුන් සුඛිත මුදිත කරන්නේය යන්නයි. ගම්බද ජනතාවට බලපාන ප්‍රශ්න විසඳන බවයි. එමනිසා ගම්බද ජනතාවට ද එම විවිධ සහන සහ සහනාධාර මත යැපීමට බලා සිටින තත්ත්වයක් නිර්මාණය වී ඇත. මෙය ශ්‍රමය කැප කරන නිෂ්පාදනමය නැඹියාවකට වඩා නිකම් සිටිමින් සහනාධාර මතින් ජීවත්වීමේ දීමනාවකට බර වූවකි.

## 4.8.5 ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ හැසිරීම් රටාව

ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ හැසිරීම් රටාවද ජනතා සහභාගිත්වය අඩු වැඩි කිරීම සඳහා සාධකයක් බවට පත්විය. කැලේගම ව්‍යාපෘතියේ ආරම්භක අවධියේදී කැලේගම ජනතාව සමග ඉතා කට්ටුවෙන් ආශ්‍රය කළ පුද්ගලයා ඒ පිළිබඳව පත්කර යැවූ ඉංජිනේරුවරයාය. කැලේගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ ජනතා සහභාගිත්ව ප්‍රවේශය මාර්ගයෙන් ග්‍රාමීය සංවර්ධන අත්දැකීමක් ලබා ගැනීම සඳහා ය. එසේ වුවත්, ප්‍රධාන ඉංජිනේරු මහතාට ජනතා සහභාගීත්ව සංකල්පය පිළිබඳව පූර්ණ අවබෝධයක් නොතිබුණු බව පෙනේ. ඔහුට දීර්ඝ අත්දැකීම් තිබුනේ මහා පරිමාණ වාරිමාර්ග ඉදිකිරීම් සම්බන්ධ වැඩබිම් සම්බන්ධයෙනි. එමනිසා, ඔහුගේ ගති හැසිරීම් රටාව වූයේ ජනතා සහභාගිත්ව ප්‍රවේශය වර්ධනය වන ආකාරයට නොවන බව නිරීක්ෂණය කල හැකිවිය. මෙනිසා ව්‍යාපෘති ප්‍රතිලාභීන් අතුරින් ඇතැම් චරිත සුවිශේෂී වූ අතර තවත් චරිත ව්‍යාපෘතිය තුල පාලනය කළ නොහැකි ඒවා බවට පත්ව තිබුණි. මෙම තත්ත්වය ජනතා සහභාගිත්වය නිවැරදිව නොලැබීම සඳහාද බලපා ඇත.

## 4.8.6 සහභාගිත්වය ලබා ගැනීමේදී භාවිතා කළ ක්‍රමවේදය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ සහභාගිත්ව සංවර්ධනය පිළිබඳව සංවර්ධන අත්දැකීමක් ලබාගැනීමේ පරමාර්ථයෙනි. ලබා ඇති අත්දැකීම් අනුව, ජන සහභාගිත්ව සංකල්පය පිළිබඳව ප්‍රබල වැටහීමක් ලැබිය යුතුව තිබුණි. දැනුවත් කිරීමේ වැඩසටහන් ව්‍යාපෘතිය ආරම්භයේදී සහ ක්‍රියාත්මක වෙමින් පැවති අවධියේදී පැවැත්වුව ද එය ප්‍රමාණවත් වූයේ නැත. ගමේ කුඩා වැව් පද්ධති පුනරුත්ථාපනය කිරීම යනු ජනතාවගේ ප්‍රධානම අවශ්‍යතාවයක් සපුරාලීමකි. එසේම එය ඔවුන්ගේ දෘෂ්‍යමාන සීමාව තුළ සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක විණි. මෙහි දී, පුනරුත්ථාපන වැඩ සඳහා දායකවීමෙන් දිනකට රුපියල් 75/- ක මුදලක් උපයා ගැනීමට ද හැකිවිය. එමනිසා, ජනතා සහභාගිත්වය උපරිම අයුරින් ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැකසී තිබුණි. එසේ වුව ද, ජනතාව තුළ පවතින විවිධ අඩුපාඩු හා ගොවි කටයුතු පර්යේෂණායතනය විසින් මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ප්‍රථම අවස්ථාව නිසා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ මෙවැනි අත්දැකීම්වල පැවති අඩුව ද ව්‍යාපෘතියේ ජනතා සහභාගිත්වය ලබා ගැනීමේ යම් යම් දුර්වලතා ඇතිවීමට හේතු වූ බව කිව හැකිය.




*රූප සටහන 1: ව්‍යාපෘතිය හා එහි ප්‍රාදේශීය සහ ජාතික පරිසරය අතර අන්තර් සම්බන්ධතාවයේ නියෝජනය.*

## 5. නිගමනය

ග්‍රාමීය සංවර්ධන කාර්යයන් ජනතාවට පූර්ණ වශයෙන් ප්‍රයෝජනවත් වන අන්දමින් සිදු කිරීම සඳහාත්, එහි තිරසාර පැවැත්ම සඳහාත්, එම සංවර්ධන කාර්යයේ සැලසුම් අවදියේ සිට ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම අවශ්‍ය බව ඉහතදී සිදුකල සමාලෝචනයෙන් පැහැදිලි වේ.

ජනතා සහභාගිත්වය ජනිත කරන ක්‍රමවේද කිහිපයක් වෙයි. බලය පා සිදුකෙරෙන සහභාගිත්වය, පොළඹවන ලද මහජන සහභාගිත්වය, ස්වාභාවික මහජන සහභාගිත්වය ආදී වශයෙනි.

යම්කිසි සංවර්ධන කාර්යයක දී ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා තවත් පාර්ශවයක් විසින් බලය පෑමක් සිදුකිරීමෙන් අදාල වැඩසටහන සඳහා ජනතා සහභාගිත්වය ලබාගැනීම බලය හා සිදු කෙරෙන සහභාගීත්වය යනුවෙන් අදහස් වෙයි. උදාහරණ වශයෙන් සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන්ගේ සහභාගිත්වය ලබාගැනීම සඳහා සමෘද්ධි සහනාධාරය භාවිතා කිරීමේ අවසරය දැකිය හැකිය. සහභාගී නොවන පුද්ගලයින් භුක්ති විඳින සමෘද්ධි සහනාධාර අහිමි කිරීමක් කරන බව මෙහිදී ප්‍රකාශ කරනු ලබයි. මෙය බලය පා සිදුකරන සහභාගීත්වයයි.

පොළඹවන ලද මහජන සහභාගිත්වය යනු ජනතාව සහභාගීත්වය උදෙසා පෙළඹවීම සඳහා යම් යම් තිලිණ ලබාදීමයි. මේ සඳහා උදාහරණ වශයෙන් ලෝක ආහාර වැඩසටහන යටතේ ජනතා සහභාගිත්වය ලබා ගැනීම උදෙසා තිළිණයක් වශයෙන් ආහාර ද්‍රව්‍ය අඩංගු මල්ලක් සහභාගිවන්නන්ට

ලබාදීම දැක්වීමට පුළුවන. මෙහි දී, ප්‍රජාවෙන් පරිබාහිරව සිට සහභාගිත්වය ජනිත කෙරේ. කල් පසුවීමේ දී ග්‍රාමීය ජනතා සහභාගිත්වය මතුවන විට සහභාගිත්වයේ වාසි අදාල ප්‍රජාවටම පැහැදිලිව දක්නට හැකිය.

ජනතා සහභාගිත්වය ජනිත වීමේ ඉතාම වැදගත්ම අංගය වන්නේ ස්වාභාවික නැතහොත් නිරායාසයෙන් සිදුවන මහජන සහභාගීත්වයයි. සමහර අවස්ථාවන්හි දී මෙම ක්‍රියාකාරකම් සඳහා ඇතැම් බාහිර උපකාර හෝ මග පෙන්වීම් අවශ්‍ය විය හැකිය. එහි අත්‍යවශ්‍යයෙන්ම ආවේණික ගුණාංගය වන්නේ මූලික පෙළඹීම් සිදුවන්නේ ජනතාව තුළින්ම වීමයි. ස්වාභාවික සහභාගීත්වය මිනිසුන් විසින් ඔවුන්හට අනුරූපී අයුරින් නිදහස්ව සිදුවන සහභාගීත්වයක් නිසා ප්‍රජාතාන්ත්‍රික ආචාර ධර්මවලට සම්පූර්ණයෙන්ම යෝග්‍ය වුවකි.

ඉහත විස්තර කරන ලද සහභාගිත්වය ජනිත කිරීමේ ක්‍රම අතරින් කැලේගම ව්‍යාපෘතියේදී ජනතා සහභාගිත්වය ජනිත කරන ලද්දේ පොළඹවන ලද ජනතා සහභාගිත්වයයි. එනම්, එක් පුද්ගලයෙකු වෙනුවෙන් දිනකට රු.75/- ක දීමනාවක් ගෙවීමයි. කැලේගම පිහිටි පසුබිම මත මෙවැනි ගෙවීමක් නොකර ජනතා සහභාගිත්වය ලබා ගැනීම දුෂ්කර කරුණක් බව කිය යුතුය. එමනිසා, ජනතා සහභාගිත්වය ජනත කිරීම සඳහා ව්‍යාපෘති පසුබිම දැඩි බලපෑමක් කරන බව පැහැදිලි වේ.

එසේ වුවද වර්තමානයේ පවතින ආර්ථික සංදර්ශයේදී ප්‍රජා සහභාගිත්ව කටයුතු සඳහා ජනතා දායකත්වයක් ලබාගැනීමට හැකිවේ ද යන්න පිළිබඳ අවධානය යොමු කළයුතු ය. වර්තමාන විවෘත ආර්ථික ප්‍රතිපත්ති රාමුවක ජීවත්වන සෑම මිනිසෙකුම ආර්ථිකමය වශයෙන් තමාට වැදගත්වන කාර්යයන් සඳහා පමණක් තම සහභාගිත්වය තීරණය කරයි. මෙහි දී, පෞද්ගලික භාණ්ඩ private goods සහ පොදු භාණ්ඩ public goods පිළිබඳ අයිතියේ ස්වභාවය ඉතා වැදගත්වේ. සමාජයේ ප්‍රජාව සෑම විටම ක්‍රියාත්මක වන්නේ තම සහභාගිත්වය ලබාදෙන්නේ ආර්ථිකමය වශයෙන් එම පුද්ගලයාට සෘජු ප්‍රතාලාභ ලබාදෙන කාර්යයන් සඳහා පමණි. එමනිසා, සමායේ පොදු භාණ්ඩ හා පොදු සේවා ජනතාවට ප්‍රතිලාභ ගෙන දෙන්නේ වුවද, ඔවුන් එහි ඇති පොදු අයිතිය නිසා එම ක්‍රියාවලියට සහභාගිත්වය ලබාදීමට මැලි වේ. ප්‍රජා සහභාගිත්වය සඳහා බලපාන සාධක ගණනාවක් පිළිබඳව ඉහත සමාලෝචනයේදී සඳහන් කලෙමි. ඒ හැම සාධකයක්ම තීරණය කරන්නේ සහභාගිවන්නාට ලැබෙන සත්‍ය ප්‍රතිලාභයේ ප්‍රමාණය මතය.

විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන වර්තමානයේ දී පූර්ණ ජනතා සහභාගිත්වයක් සහතික කර ගැනීම ගැටලු සහගත කරුණක් වීමට පුළුවන. එසේ හෙයින්, ග්‍රාමීය සංවර්ධනයේදී ජනතා සහභාගිත්ව ප්‍රවේශය නොතකා හැරිය යුතු නොවේ. එනම් පූර්ණ ප්‍රජා සහභාගිත්වය මත ජනතාවට උපරිම ප්‍රතිලාභ ගෙන දෙන ලෙස ව්‍යාපෘතිය සැලසුම් කිරීමට හැකිවීම නිසා අදාළ ව්‍යාපෘතිය පිළිබඳ අයිතිවාසිකමක් පිළිබඳ හැඟීමක් සහභාගී වූ ප්‍රජාව තුළ ඇතිවීම හේතුවෙන් එහි තිරසර බවක් ඇතිවීමයි.

ග්‍රාමීය සංවර්ධන කාර්යයන් හි යෙදෙන්නන් විසින් මෙම දුර්වලතාවය මගහරවා ගනිමින් සාර්ථක අන්දමින් ග්‍රාමීය සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සඳහා යම් යම් ක්‍රමෝපායයන් අනුගමනය කිරීම සිදු වේ. එවැනි එක් මාදිලියක් ලෙස ඉහතින් විස්තර කළ ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මත සිදුකළ කැලේගම කුඩා වැව් පුනරුත්ථාපන වැඩසටහන දැක්වීමට පුළුවන. මෙම මාදිලියේ දී දිළිඳු ප්‍රජාවගේ සහභාගිත්වය ඔවුන්ගේම වැව් පුනරුත්ථාපන කටයුතු සඳහා ලබාගත්තේ එදිනෙදා ජීවත්වීම සඳහා සුළු දීමනාවක් ගෙවීමෙනි. එනම්, දිනකට රුපියල් 75/- ක මුදලකි. දිගු කාලීන සංවර්ධන කටයුත්තක් සඳහා දිගින් දිගටම ශ්‍රමය සැපයීමක නිරත වුවහොත් දිළිඳු ගම් වැසියන්ට එදිනෙදා ජීවත් වීමට මුදල් නොමැති වේ. එමනිසා, එවැනි තත්ත්වයක් ඇති වීම වලක්වා ගමේ

ජනතාවගේ සහබාගිත්වය ව්‍යාපාතියේ සැලසුම් අවධියේ සිට ප්‍රථිලාභ ලබන අවදිය දක්වා සතුටුදායක ලෙස ලබා ගැනීමට මෙම දීමනාව ගෙවීම නිසා හැකියා ලැබුණි. ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමේ උපක්‍රමයක් ලෙස ගම් වැසියන්ට එදිනෙදා අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා ප්‍රමාණවත් දීමනාවක් ලබා දීම පැවති පසුබිම මත කළ යුතු වූ දෙයක් විය.

ඒ සඳහා සහභාගිවන්නන්ට මුදල් ගෙවීම මගින් ලබා ගැනීමෙන් සිදු වූයේ ජනතා සහභාගිත්ව සංකල්පය පසපසට තල්ලු වී මුදල් උපයා ගැනීමේ මානසිකත්වයක් ගොවි ප්‍රජාව තුළ ගොඩ නැගීමයි. එමනිසා, මුදල් ගෙවීමකින් තොරව කිසිම කාර්යයක් එම වැඩබිම තුළ ඔවුන් ලබා කරවාගත නොහැකි තත්ත්වයට ව්‍යාපෘතිය පත්විය. ව්‍යාපෘතියේ අවසාන අදියරේදී වැව් ආශ්‍රිත ගස් ගොම්මන වඩා වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වන වගාවක් සඳහා පැළ සිටුවීමේ වැඩසටහනේ දී ඒ සඳහා මුදල් ලබානොගෙන ස්වේච්ඡාවෙන් පැළ සිටුවීම ගොවි ප්‍රජාව ප්‍රතික්ෂේප කර ඇත. මෙයින් පැහැදිලි වන්නේ, ජනතා සහභාගිත්වය යන සංකල්පය ජනතාව තුලින් ඉවත්ව ගොස් තිබූ ආකාරයයි. එමනිසා, මෙලෙස මුදල් ගෙවීමෙන් ලබාගත් ජනතා සහභාගිත්වය, ජනතා සහභාගිත්වය ලෙසින් ඉහතින් අර්ථ දැක් වූ නිර්ව්‍යාජ ජනතා සහභාගිත්ව ආදර්ශකයක් ලෙස යළිත් භාවිතයට ගන්නා ලෙස මෙම අත්දැකීම අනුව නිර්දේශ කළ නොහැකි බව මෙහි අද්දැකීමයි.

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති සැලසුම්කිරීම, ව්‍යපෘති අධීක්ෂණය කිරීම සහ කෙටි කාලීන ව්‍යාපෘතියක් නම් එය ක්‍රියාත්මක කිරීම වැනි ග්‍රාමීය ජනයාගේ සහභාගිත්වය ලබා ගැනීම ග්‍රාමීය මට්ටමේදී ක්‍රියාකාරී සංවිධාන වශයෙන් පවතින ප්‍රජා සංවිධානයන් වන අන්‍යෝන්‍යාධාර සමිති, සමෘද්ධි සමිති, ක්‍රියාකාරී ගොවි සංවිධාන, ස.ණ.ස. සමිති වැනි සංවිධානයන් තුලින් ලබාගත හැකිය. ඉහත දැක් වූ ක්‍රියාකාරී සංවිධාන මාර්ගයෙන් අදාළ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ කරුණු වටහා දීමක් පුළුල් ආකාරයෙන් කිරීමට හැකි වේ. එම අවබෝධය මත ග්‍රාමීය සංවර්ධන කටයුතු ජනතාවගේ අවශ්‍යතාවය පරිදි සැලසුම් කිරීමට හැකිය. එවැනි ප්‍රජා සංවිධාන වලට එම ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පවරා ගැනීමට හැකියාව ඇත. එවැනි තත්ත්වයක් යටතේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු විසින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘතියකට වඩා එවැනි ව්‍යාපෘතියක් ජනතාව විසින්ම සැලසුම් කළ, ජනතාව විසින්ම ක්‍රියාත්මක කළ, ජනතාවගේම ව්‍යපෘතියක් යන හැඟීම ඇති වේ. ඒ අනුව, එහි තිරසර බවක් ඇති වේ.

පූර්ණ සහභාගිත්වයක් සහතික කරමින් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ තවත් මාදිලියක් ලෙස ස්ව උපකාරක ග්‍රාමීය සංවර්ධන සමාගම් මාදිලිය ද වැදගත්ය. මෙවැනි ව්‍යාපෘති පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි කලාපයේ, මහවැලි ප්‍රතිව්‍යුහාත්මක වැඩසටහන මගින් හඳුන්වා දී ඇත. මේවා Village Self Help and Learning Initichive (VISHLI) ව්‍යාපෘති නමින් හඳුන්වා ඇත. අසංවර්ධිත ග්‍රාමීය පෙදෙස්වල ජනතා සහභාගිත්ව ක්‍රමෝපායයන් භාවිතා කරමින් ජනතා අවශ්‍යතාවයන්ගේ ප්‍රමාඛතාවය අනුව ඒවා ඉටු කරදීම සඳහා VISHLI ව්‍යාපෘතිය මුදල් සපයා දෙයි. අදාල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය ඇස්තමේන්තුවක් පිලියෙල කර එයින් 20% ප්‍රජාවගේ ශ්‍රමයෙන්ද, 10% ප්‍රජාවගේ මුදල්මය දායකත්වයෙන් ද, ඉතිරි 70% VISHLI ව්‍යාපෘතිය විසින් ද, ලබා දෙයි. ස්ව උපකාර ග්‍රාමීය සංවර්ධන සමාගම් නමැති මෙම මාදිලියේදී ජනතාවගේ සම්පත් ජනතාවගේ ශ්‍රමය සහ සහභාගිත්වය ද ඇතිව රජයේ හෝ වෙනත් පිටස්තර සම්පත් සමග ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් භාවිතා කිරීමක් සිදුවෙයි. මෙහිදී ද, සතුටුදායක ප්‍රජා සහභාගිත්වයක් අත්දැකීමට පුළුවන.

ඉහත විග්‍රහය මත ග්‍රාමීය සංවර්ධනයේ දී ප්‍රජා සහභාගිත්ව ප්‍රවේශය නොතකා හැරීමට නොහැකිය. සංවර්ධන සැළසුම් මගින් මහජයා විසින් සංවර්ධනය කිරීමට ඉඩදිය යුතුය. SAAPE (2003) සම්පත් තිරසාර ලෙස ආයෝජනය කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය අත්‍යවශ්‍යය. වර්තමාන විවෘත ආර්ථික රාමුව තුළ මිනිසා සිය තීරණ ගැනීම තමා වෙත ලැබෙන ප්‍රථිලාභ ප්‍රමාණය මත තීරණය කරන පරිසරයක් මත සංවර්ධනයේ දී, ප්‍රජා සහභාගිත්වයක් ලබා ගැනීමට අප්‍රතිහතව ක්‍රියාත්මක වීම

අවශ්‍ය වේ. යහපත් රාජ්‍ය පාලනය පිළිබඳ සංකල්පයේදී ද, සංවර්ධනය සඳහා වැය කරන සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ සමාජයට හිමිකරදීම අපේක්ෂා කරයි. ජනතා සහභාගිත්ව ප්‍රවේශය ද අදාල ජනතාව සිය සංවර්ධනය සඳහා ගතින් හා සිතින් ඒකාබද්ධ කරමින් උත්කෘෂ්ඨ මානව පැවැත්මකින් යුතුව ක්‍රියා කිරීමට භාවිත කරන සංවර්ධන මෙවලමකි. ශ්‍රී ලංකාවේ අතීත සමාජයේ ජනතාව විසින් අනුගමනය කළ සමාජය විසින්ම සමාජයේ අසංවර්ධිත බව පිටුදැක ජනතා සහභාගිත්ව ක්‍රියාවලියක් මගින් සංවර්ධනය ඇතිකර ගැනීමේ මහගු කාර්යය වර්තමානයට ද අදාළය.

## References


1. Abyeratna, S.D. (1985) Village Irrigation in Sri Lanka, Journal of Social Sciences, PP 131-144
2. Bower, I.B. (1977) Communication Avtion Research Feedback, RRDC Bulletin, pp 34-42
3. Central Bank of Sri Lanka, Annual Report 2001
4. Chandrasiri, J.K.M.D. (2002) Sri Lanka Journal of Agrarian Studies, Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo.
5. Clarke, A.C. (1972) Observer Magazine 29th October, pp7-12
6. Coben.J.M.ad Uphoff.N.T. (1977) Rural Development Participation : Concept and Measures for Project Design, Implementation and Evaluation, Rural Development Monograph No.2, Center For Internationl Studies, Cormel University Ithaca, New York, pp 317.
7. Departement of Census and Statistics (1995) Statistical Abstract, Colombo.
8. Korten D Alfonso, F. (eds) (1981) Bureaucracy and the Poor: closing thegrop Manila, Asian Institute of Management.
9. Learch, E.R. (1968) Pul Eliya. Chambridge University pres. Government of Sri Lanka, Office of the President (1996), Presidential Task Force by Self Sufficiency in Food Production, Colombo.
10. Myrdal, J. (1986) Community Participaion, Social Develoment and the State, Methuen, pp 181.
11. Myrdal, G. (1970) Challenge of World Poverty, New York, Pantheon Books.
12. Nanayakkara, V.K. (2006) Gamanegumata kethat aruna Programme, Hand out, Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo.
13. Oalkey, Pand Marsden D. (1982) Obstacks Approaches to Participation in Rural Development ILO, Geneva, pp 88.
14. Schumacher, E.F. (1973) Small is beautiful London, Abacus, Oakley. Projects with people, The Practice of Participation in Rural Development, ILO, Geneva, pp VII+24
15. Verma, *et.al*, (1973) Action Research and the Production of Communication Media, Report of the All India Field Workshop.